නාගාර්ජුන පාදයන්ගේ මූලමාධ්‍යමකකාරිකාවත් සමඟ වඩාත් දාර්ශනික ගුරු කුලයක් බවට පත් වන මාධ්‍යමක දර්ශනය එක්තරා ගූඪ සිද්ධාන්තයක් වූ සාපේක්ෂතාවාදය විවරණයට ප්‍රතීත්‍ය සමුප්පාදය ප්‍රතිෂ්ඨා කොට ගෙන ඉදිරිපත් විය. දෙසටක් මිත්‍යා දෘෂ්ටීන් අතර ප්‍රබලව පැවති ධර්ම ආත්මවාදය ඛණ්ඩනය කරමින් සියලු ධර්මයන් ස්වභාවයෙන් තොරය, ශූන්‍යය යන්න කාරිකාවෙන් සනාථ කළහ. මේ සඳහා මුල් බුදුසමයාගත ප්‍රතීත්‍යසමුප්පාදය යොදා ගනු ලැබීය. තත් දර්ශනයට අනුව නාගාර්ජුන පාදයෝ හේතු ප්‍රත්‍ය සමවායෙන් හට ගන්නා සියල්ල අනාත්ම ලක්ෂණයෙන් යුක්ත වන බවත්, එම නිසා ශූන්‍ය වන බවත් දක්වන ලදී. මූලමාධ්‍යමකකාරිකාවෙන් තහවුරු කරනු ලබන ශූන්‍යතා සිද්ධාන්තය පිළිබඳ මෑතකාලීන විද්වතුන්ගේ ඒකමතිකත්වයක් ද නොමැත. ඒ අනුව නාගාර්ජුන පාදයන් ස්මතු කරන ශූන්‍යතා දර්ශනය මානව ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයෙන් හා බුද්ධි ගෝචර භාවයෙන් බැහැර වූවක් ද යන්න පිළිබඳ දාර්ශනික ගැටළුවක් ද ස්මතු වේ. එය මෙම පර්යේෂණයේ ද පර්යේෂණ ගැටළුවයි. ශූන්‍යතා දර්ශනය මුල් බුදු සමයට පටහැනි නව්‍ය දර්ශනයක් නොවන බවත්, බුදුන් ජීවමාන සමයෙහි ම ශූන්‍යතාව පිළිබඳ කරන ලද මෝඝරාජ, මූල පරියාය, සුඤ්ඤත ආදී සූත්‍රයන්ගෙන් ද සනාථ වේ. ''සර්ව දෘෂ්ටි ප්‍රහාණාය'' යනුවෙන් සියලු දෘෂ්ටි ප්‍රහානය කරමින් මධ්‍යම ප්‍රතිපදාව, ප්‍රතීත්‍යසමුප්පාදය හා ශූන්‍යතාව සමානාර්ථයෙන් යුතුව ස්මතු කරයි. කච්චායනගොත්ත ආදී සූත්‍රයන්හිද මොනවට විග්‍රහ කරන මෙම දර්ශනය පුද්ගලයාට දුරස්ථ නොවේ. හේතුවත් ඵලයත් අතර පවත්නා අන්තර්පරායත්තතාව අග්නි ඉන්ධන උපමාව තුළින් පෙන්නුම් කරන අතර ඒවා අතර පවත්නා සාපේක්ෂක සම්බන්ධතාවය නල කලාප සූත්‍රය මගින් ද සනාථ කරනු ලබයි. නාමරූප හා විඥානයද එකිනෙකට ස්වාධීන නොවේ. ශූන්‍යතාව අවබෝධයට නම් සංකල්ප වලින් නිදහස්ව දෘෂ්ටි වලින් මිදිය යුතුය. ශූන්‍යතාවය ද දෘෂ්ටියක් වශයෙන් නොගත යුතුය. කාරිකාවේ ප්‍රධාන පරමාර්ථය දෘෂ්ටි ප්‍රහානය වන අතර එය ශූන්‍යතාව කරා මෙහෙයවා ලැබිය යුතු අවබෝධය කරා යාමට මානව ගෝචර උපමා ආදිය භාවිතා කර තිබීම විශිෂ්ටය. උග්ඝටිතඤ්ඤ, විපටිතඤ්ඤ, ඤෙයිය යන පිරිස් කෙරෙහි ස්වකීය අවබෝධ ඥානයෙන් ලැබිය හැකි ස්වභාවයක් ලෙස සනාථ කරයි. මේ සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍රය භාවිතා කෙරේ. යමෙක් ධර්මය දකීමෙන් ප්‍රතීත්‍ය සමුප්පාදය දකීද හෙතෙම ශූන්‍යතාව හඳුනා ගනී. එනම් ශූන්‍යතාවය ම ශූන්‍යය යයි ප්‍රත්‍යක්ෂයෙන් දකී. මේ අනුව තත් දර්ශනය මානව ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයෙන් තොරවූවක් නොවන බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද : නාගාර්ජුනපාද, පටිච්චසමුප්පාද, මූලමාධ්‍යමකකාරිකාව, අන්තර්පරායත්ත, ශූන්‍යතාව

# බුද්ධ චරිතය තුළින් විද්‍යමාන මානුෂීය ලක්ෂණයන් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

**රශ්මි කෞශල්‍යා ප්‍රියසාද්**
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය
නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, කැලණිය.
rashmikawshalyapriyasad@gmail.com

පාලි මූලාශ්‍රයවල අන්තර්ගත බෝධිසත්ත්ව සංකල්පය එක් යුගයකට අයත් නැති බවත් එම සංකල්පය හා සම්බන්ධ වාර්තාවල ඇති සංවර්ධනාත්මක ස්වරූපය අනුව ඒවා ක්‍රමානුකූලව විකාශනය වන්නට ඇති බවත් නිගමනය කළ හැකිය. බුදුරජාණන් වහන්සේගේ උත්තරීතර මිනිසකු වශයෙන් දැක්වෙන වාර්තා සහ මූලාශ්‍රය මුල්ම යුගයටත් බුද්ධ චරිතයේ වඩා ආශ්චර්යවත් අද්භූත සිදුවීම් හා දෙවියන් සම්බන්ධ වාර්තා තවත් අවස්ථාවකටත් වෙන් කළ හැකි අයුරු නිරීක්ෂණය විය. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ සූත්‍ර පිටකයේ විසිරී ඇති බෝසතුන් සාමාන්‍ය උත්තරීතර මිනිසකු වශයෙන් විද්‍යාමාන කරළීමයි. මෙම පර්යේෂණයේ දී ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රයන් දායක කර ගනු ලැබේ. බෝධිසත්ව සංකල්පය සම්බන්ධ වර්ධනීය හා දියුණු අදහස් විද්‍යමාන සූත්‍ර පිටකයේ විසිරී ඇති බෝසතුන් සාමාන්‍ය උත්තරීතර මිනිසකු වශයෙන් හඳුන්වනවාට වඩා ආශ්චර්යජනක අද්භූත පුද්ගලයකු වශයෙන් ඉස්මතු කිරීම සුදුසු ද? එහි දී දේව මාරාදීන්ගේ සම්බන්ධය ද පෙන්වා උන්වහන්සේ දෙවියන්ට වඩා උසස් තත්වයට පත් කරනුයේ කෙසේ ද? අරියපරියේසන සූත්‍රයේ දැක්වෙන්නේ ඉතා සරල බුද්ධ චරිතයකි. උදාහරණ වශයෙන් එහි බෝසතුන්ගේ අභිනිෂ්ක්‍රමණය පෙන්වා දිය හැකිය. එහි දේව මාරාදී කිසිවකු ගැන සඳහන් නොවේ. දෙමවුපියන් අඬමින් සිටියදී විශ්වසනීය ලෙස අභිනිෂ්ක්‍රමණය සිදුවී ඇති බව වාර්තා වේ. නමුත්, දීඝනිකායේ මහාපදාන සූත්‍රයේ ආශ්චර්ය අද්භූත සිදුවීම් තුළින් බුද්ධ චරිතය සරසා ඇත. විශේෂයෙන්ම මවුකුස පිළිසිඳ ගැනීම හා උපත පූර්ව නියමයක් හා පැතුමක් අනුව සිදුවන බව එහි සඳහන් වේ. බුද්ධිමත් ශ්‍රාවකයන් උන්වහන්සේ ගැඹුරින් අවබෝධ කර ගන්නට ඇති අතර සාමාන්‍ය ජනයා තම ආගමික මති මතාන්තර හා විශ්වාස ආරෝපණය කරමින් බුදුරදුන් ගැන සිතන්නට ඇත. මේ අයුරින් බුදුරදුන් වටා දෙයාකාරයක විවරණයක් ඉදිරිපත් කරන්නට ඇති අතර මහායාන බුදුසමය මඟින් මෙය උපරිම භාවයට නැංවෙන්නට විය. එහි ප්‍රතිඵලය වූයේ උන්වහන්සේ සර්ව බලධාරී දෙවියකු බවට පත්වීමයි. එහෙත් ථෙරවාදී සම්ප්‍රදාය කොතරම් අද්භූත ජනක සිදුවීම්වලින් හා සුරංගනා කථාවලින් බුද්ධ චරිතය සැරසුවත් උන්වහන්සේ මනුෂ්‍යයකු බව අමතක කර නොමැති බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද** : බෝධිසත්ත්වයන් වහන්සේ, බෝධිසත්ත්ව සංකල්ප, මානුෂීය ලක්ෂණ, ථෙරවාදී සම්ප්‍රදාය,

# සූත්‍ර සාහිත්‍යය තුළ 'මානසික ක්‍රියාකාරිත්වය' ද්වෛතවාදය හා ඒකත්වවාදය නමැති චින්තන ධාරා අන්ත දෙකට ම නොවැටී මධ්‍යම ස්ථාවරයක පිහිටීම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

**රශ්මි කෞශල්‍යා ප්‍රියසාද්**
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය
නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, කැලණිය.
rashmikawshalyapriyasad@gmail.com

පුද්ගලයාගේ කායික හා මානසික දෙඅංශය හැඳිනගන්නට දාර්ශනික හා ආගමික ඉතිහාසය තුළ විවිධ ප්‍රයත්න දරා ඇති අතර ඒ සියලු ප්‍රයත්නයන් ප්‍රධාන ධාරා දෙකකට බෙදා දැක්විය හැකි ය. එනම් මානසිකත්වය පුද්ගල ශරීරයෙන් සපුරා ස්වාධීන වූ ස්වායත්ත පදාර්ථයක් ලෙස හැඳිනගැනීම (ද්වෛතවාදය) හා මානසිකත්වය පුද්ගල ශාරීරික ක්‍රියාකාරිත්වයේ ම අතුරු ගුණයක් ලෙස සැලකීම (ඒකත්වවාදය) යන මතවාද දෙකයි. කය හා මනස යනු එකිනෙකට සපුරා වෙනස් දෙකක් බවත්, මනස කයට ප්‍රතිපක්ෂ ව සදාතනික ව පවතින යථාර්ථයක් බවත් පිළිගත හැකි ද? එමෙන් ම කය හා මනස යන දෙක ම එකක් බවත්, මනස යනු කයේ ම ප්‍රකාශනයක් වන අතර කයත් සමඟ මනසත් විනාශයට යන බව කිව හැකි ද? බෞද්ධ මූලාශ්‍රයන්හි පුද්ගල මානසික ක්‍රියාකාරිත්වය මුලින් දැක් වූ ප්‍රධාන චින්තන ධාරා දෙකින් එකකටවත් එය ඇතුළත් කළ නො හැකි බව නිරීක්ෂණය විය. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ මානසික ක්‍රියාකාරිත්වය පිළිබඳ පාලි සූත්‍ර සාහිත්‍යයෙහි එන විග්‍රහය ද්වෛතවාදය හා ඒකත්වවාදය නමැති චින්තන ධාරා අන්ත දෙකට ම නොවැටී මධ්‍යම ස්ථාවරයක පිහිටීම විද්‍යාමාන කරළීමයි. මෙම පර්යේෂණයේ දී ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රයන් දායක කර ගනු ලැබේ. බෞද්ධ මූලාශ්‍රයන්හි මානසික ක්‍රියාකාරිත්වය හැඳින්වීමට තනි පදයක් නොව පර්යාය නාම කිහිපයක්ම භාවිත ව ඇත. තනි පදයක් මඟින් මානසික ක්‍රියාකාරිත්වය නො දක්වා පද කිහිපයකින් යොදා ගැනීම මඟින් පැහැදිලි වන්නේ බුදු දහම තුළ මානසික ක්‍රියාකාරිත්වයේ සංකීර්ණත්වය හා විපරිණාමී බව ඉස්මතු කර ඇති ආකාරයයි. පාලි සූත්‍රයන්හි මානසික ක්‍රියාකාරීත්වය හැඳින්වීමට යොදන පද වන්නේ චිත්ත, මනෝ, විඤ්ඤාණ, චෙතො, නාම යන ඒවායි. මේ අතරින් චිත්ත, මනෝ, විඤ්ඤාණ යන පද තුන බහුල ව යෙදී ඇති අතර ඒ පද තුන මඟින් ම අදහස් වන්නේ එක ම වූ මානසික ප්‍රවාහය බව සූත්‍ර සාහිත්‍යයේ ම දැක් වේ. මධ්‍යම යනු 'මැද' නොව අන්තවලින් ඉවත්වීමයි. පාලි සූත්‍රාගත බෞද්ධ විග්‍රහය එම ස්ථාවරයේ පිහිටන ගමන් සංකීර්ණ මානසික ක්‍රියාකාරිත්වය, එහි විචිත්‍රත්වය හා මානසික සංවර්ධනය මැනවින් විස්තර කරන බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද :** මානසික ක්‍රියාකාරිත්වය, ද්වෛතවාදය, ඒකත්වවාදය, මධ්‍යම ස්ථාවරය, සූත්‍ර සාහිත්‍යය

# බෝධිසත්ත්ව චරිතයෙන් පිළිඹිබු වන සමාජ වෘතවේදය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**රාජපක්ෂ, ඩබ්ලිව්.ඒ.එන්.එම්.**
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, මානවශාස්ත්‍ර පීඨය,
කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
nadeeshar85@gmail.com

විවිධ සමාජ, ආර්ථික, මානසික අභියෝගවලට මුහුණදෙන පුද්ගලයන්ට සහාය වෙමින් මානව යහපැවැත්ම සඳහා කටයුතු කිරීම සමාජ වෘතවේදය ලෙස සරලව අර්ථකථනය කළ හැකිය. බුදුදහමට අනුව මෙම සමාජ වෘතවේදී ලක්ෂණ මැනැවින් විශද වන්නේ බෝධිසත්ත්ව චරිතයෙනි. දාන, සීල ආදී චර්යාවන්ගේ නියුතු පුද්ගලයා හෙවත් සත්‍යාවබෝධය පිණිස ධර්ම චර්යාවේ ඇලුණු පුද්ගලයා බෝධිසත්ත්වරයා ලෙස හැඳින්වේ. මෙම බෝසත් චරිතය පුරා ම දක්නට ලැබෙනුයේ අන්‍යයන්ගේ හා සමාජයේ යහපත වෙනුවෙන් කැපවෙන පුද්ගලයෙකුගේ චරිත ලක්ෂණයි. එම නිසා ම බෝධිසත්ත්වවරයා යනු පරාර්ථ චර්යාවේ නියුතු සමාජ වෘතවේදියෙකු ලෙස අර්ථ දැක්වීම යුක්ති සහගත වේ. ඒ අනුව මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ බවට පත් වන්නේ බෝධිසත්ත්ව චරිතයෙන් පිළිඹිබු වන සමාජ වෘතවේදය පිළිබඳ අධ්‍යයනය කිරීමයි. ඒ සඳහා මූලික වශයෙන් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය අධ්‍යයනය කිරීම සිදු වේ. සසර දුක් විඳින සත්ත්වයා ඉන් මුදවා ගැනීම පිණිස බෝසත්වරයා ද නැවත නැවත සසරේ උපදියි. එමඟින් උන්වහන්සේ සතු වන පරාර්ථ චර්යාවේ මහිමය ප්‍රකට වේ. තම ජීවිතය කැප කරමින් අන්‍යයන්ගේ යහපත උදෙසා ම කටයුතු කිරීමේ මෙම ගුණාංගය සමාජ වෘතවේදය සඳහා අදාළ කර ගත යුත්තකි. ඒ අනුව බෝධිසත්ත්ව චරිතය තුළින් සමාජ වෘතවේදය පිළිඹිබු වන්නේ ද? යන්න විමසා බැලීම මෙහි පර්යේෂණ ගැටලුවයි. සමාජයේ වෙසෙන සියල්ලන් සමඟ එකට එකතු වී වැඩ කරමින්, උදව් උපකාර කර ගනිමින් ජීවත් වීම ද බෝසත් චරිතයෙන් විශද වන වටිනා ගුණාංගයකි. එසේ උන්වහන්සේ ක්‍රියා කළ ද කිසිවිටෙකත් නැවත යමක් තමාට බලාපොරොත්තු නොවේ. මෙය සමාජ සේවයේ නිරත වීමේ දී අත්‍යවශ්‍යයෙන් ම පැවතිය යුතු ගුණාංගයකි. සමාජ සේවයේ නිරත වීමේ දී තමාට අයත් වැඩ කොටස ඉටු කිරීම විනා නැවත කිසිදු ලාභයක්, ප්‍රශංසාවක් බලාපොරොත්තු නොවී කටයුතු කිරීමට වග බලා ගත යුතුය. තවද සමාජ සේවයේ නිරත වීමේ දී තමා සතු බොහෝ වටිනා දේවල් කැපකිරීමට සිදු වේ. එසේ වුවද තම උදාර පරමාර්ථය වන පරාර්ථ චර්යාවේ නිරත වීම කිසිදු විටෙක අත් නොහැරිය යුතුය. මෙය ද බෝසත් චරිතයෙන් විශද වන සමාජ වෘතවේදයයි. දාන, සීල ආදී වූ දස පාරමිතා පූරණය මඟින් ද බෝසත්වරයා සිදු කරනුයේ සමාජ සේවයේ නිරත වීමේ දී තමා තුළ පැවතිය යුතු ගුණාංග සංවර්ධනය කර ගැනීමයි. එම ගුණාංග එකිනෙක පිළිබඳ විමසා බැලීමෙන් ඒවා ද සමාජ වෘතවේදය පිණිස ඉවහල් කර ගත හැකි බව පැහැදිලි වේ. ඒ අනුව බෝධිසත්ත්ව චරිතය තුළින් සමාජ යහපත පිණිස, වැඩ පිණිස ඉවහල් වන සමාජ වෘතවේදය විශද වන බව යථෝක්ථ කරුණු මඟින් නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පදඃ** දස පාරමිතා, පරාර්ථ චර්යාව, බෝධිසත්ත්ව චරිතය, සමාජය, සමාජ වෘතවේදය

# නූතන අධ්‍යාපන ගැටලු කළමනාකරණය විෂයයෙහි ත්‍රිශික්ෂාව මනෝචිකිත්සාවක් ලෙස ක්‍රියාත්මක වන්නේ ද යන්න පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**යූ. එස්. ඉන්දීවරී කරුණානායක,**
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය
saleelakarunanayaka@gmail.com

පුද්ගලයා තුළ දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය කිරීමේ ක්‍රියාවලිය අධ්‍යාපනය නම් වේ. අධ්‍යාපනය ඉගෙනීම, ඉගැන්වීම, ඇගයීම, රසවිඳීම, පුහුණුව ආදී පුළුල් ක්ෂේත්‍රයක විහිදී ඇත. බුදු දහම අධ්‍යාපනය යාවජීව ක්‍රියාවලියක් ලෙස සලකයි. පාසල් සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය වර්තමානය වන විට අවිධිමත් භාවයට පත්ව තිබීම සමාජය තුළින් නිරීක්ෂණය විය. ගෝලීය වසංගත අර්බුදය හමුවේ ඉගෙ නුම් ක්‍රියාවලියට බාධා පැමිණි අතර ශිෂ්‍යයන්ගේ අධ්‍යාපනික උනන්දු, උද්‍යෝගය අවකරණය වී ඇත. මෙවන් සමාජ වාතාවරණයක පාසල් සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය නැවැත විධිමත් කිරීම, අධ්‍යාපන ගැටලු කළමනාකරණය විෂයයෙහි උපයුක්ත කරගත හැකි බෞද්ධ උපදේශනයන් අතර ත්‍රිශික්ෂාව ප්‍රධාන වේ. අධ්‍යාපනය හා බුදු දහම සාකච්ඡාවේ දී ත්‍රිශික්ෂාව මනෝ චිකිත්සාවක් ලෙස ක්‍රියාත්මක වන අයුරු දැකිය හැකිය. සීල, සමාධි, ප්‍රඥා යන අනුපූර්ව ප්‍රතිපදාව නූතන මනෝවිද්‍යාවේ ප්‍රජානන චර්යාවාදී චිකිත්සාව ලෙස භාවිත වේ. අධ්‍යාපනය තුළින් දැනීම, අවබෝධය, ප්‍රඥාව, ලැබීමට පූර්ව විනය පැවතිය යුතුය. කායික හා වාචසික සංවරය හෙවත් සීල ශික්ෂාව පැවතීම අත්‍යාවශ්‍යය. සීලය තුළින් හික්මීමෙන් වහා සිත එකග වේ. දමනය වූ සිතක අවධානය, ඒකාග්‍රතාව ඇති කර ගැනීම පහසුය. එනම් සමාධි ශික්ෂාව යි. එකග වූ සිතක දැනුම, අවබෝධය, ප්‍රඥාව වර්ධනය වේ. ප්‍රඥා ශික්ෂාව මේ තුළින් ගම්‍ය වේ. ඒ අනුව සීලය තුළින් චර්යාත්මක ප්‍රතිකාරය, සමාධිය තුළින් මානසික ප්‍රතිකාරය, ප්‍රඥාව තුළින් අවබෝධාත්මක ප්‍රතිකාරය ලෙසින් මනෝචිකිත්සාවක් ක්‍රියාත්මක වේ. නූතන අධ්‍යාපන ගැටලු කළමනාකරණය විෂයයෙහි ත්‍රිශික්ෂාව මනෝචිකිත්සාවක් ලෙස ක්‍රියාත්මක වන්නේ ද? යන්න පර්යේෂණ ගැටලුව වේ. නූතන අධ්‍යාපන ගැටලු කළමණාකරණය කිරීම, සීලය තුළින් දරුවන්ගේ චර්යාව සංස්කරණය කිරීම, සමාධිය තුළින් සතිමත් ප්‍රජාවක් බිහි කිරීම, ආනාපානසති භාවනාව වැනි භාවනා අධ්‍යාපන ක්‍රියාවලියට ප්‍රායෝගිකව යොදා ගැනීම අරමුණු වේ. අධ්‍යයන ක්‍රමවේදය ලෙස පුස්තකාලයීය ගවේෂණ ඇසුරින් සාහිත්‍ය මූලාශ්‍රය ඔස්සේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය හා විශ්ලේෂණ ප්‍රවේශය භාවිත කෙරේ. ප්‍රාථමික මූලාශ්‍රය අධ්‍යයනයේ දී මූලික වශයෙන් ත්‍රිපිටකය, ද්විතීයික මූලාශ්‍රය ලෙස අධ්‍යාපනය, අධ්‍යාපන මනෝවිද්‍යාව, ත්‍රිශික්ෂාව හා බෞද්ධ භාවනාව සම්බන්ධ ව ලියැ වී ඇති ශාස්ත්‍රීය ග්‍රන්ථ, ලිපි ආදිය පරිශීලනය කෙරිණි නූතන අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ත්‍රිශික්ෂාව උපයෝගී කර ගනිමින් සිල්වත්, සදාචාරාත්මක, නැණවත් සමාජයක් බිහි කිරීමට අවධානය යොමු කිරීම කාලෝචිතය.

**ප්‍රමුඛ පද-** අධ්‍යාපන ගැටලු, ප්‍රඥා, භාවනාව, සමාධි, සීල

# බාල අපරාධ අවම කිරීමෙහිලා ඉරිදා දින දහම්පාසල් අධ්‍යාපනයේ ඇති වැදගත්කම පිළිබඳ අධ්‍යයනයක්
## (රන්මුතුගල සහ මාකොළ සහතික කළ පාසල් ඇසුරෙන්)

**අබේකෝන්.ඒ.එම්.ඩබ්.ජී.ඩී.බී.**
අපරාධවිද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
*davindaabeykoon@gmail.com*

ළමයා යන භූමිකාව තුළ සිය තත්ත්වය අභිබවා යමින් ඇතැම් ළමා ප්‍රජාවන් අපචාරයන් කෙරෙහි නැඹුරු වීමක් දැකගත හැක. ඒ අනුව ළමා අපරාධ වාර්තා වීම ඉහළ යාම සමකාලීන සමාජය තුළ ප්‍රබල සමාජ ගැටළුවක් බවට පත් වී ඇත. මෙය බාල අපරාධ ලෙස හඳුන්වයි. ඒ අනුව වර්ධනය වන ළමා අපරාධ අවම කිරීමට ඉරිදා දින දහම් පාසල් අධ්‍යාපනය කොතෙක් දුරට පාදක කරගත හැකිද යන්න මෙහි පර්යේෂණ ගැටළුව යි. ළමුන්ගේ ආකල්ප, සාරධර්ම සහ චර්යාවන් කෙරෙහි දහම් පාසල් අධ්‍යාපනයේ බලපෑම අධ්‍යයනය කිරීමත්, බාල අපරාධ අවම කිරීම සඳහා ගුණාත්මක යෝජනා ඉදිරිපත් කිරීම මෙහි ප්‍රමුඛ අරමුණ වී ඇත. ඒ අනුව රන්මුතුගල සහ මාකොළ සහතික කළ පාසල් අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් තෝරා ගන්නා ලදී. මාකොළ සහතික කළ පාසලෙන් බෞද්ධ පිරිමි ළමුන් සමස්ථයම එනම් 22ක් ද රන්මුතුගල සහතික කළ පාසලෙන් ගැහැණු බෞද්ධ ළමා වරදකාරිනියන් සමස්ථයම එනම් 13ක් ද වශයෙන් ගෙන සමස්ථ සංගහනයම (33) අධ්‍යනයට බඳුන් කරගනිමින් ගුණාත්මක ආකාරයට විශ්ලේෂණය සිදුකොට ඇත. ඒ අනුව මෙම අධ්‍යයනය තුළින් අනාවරණය වූයේ පිරිමි ළමා වරදකරුවන් වැඩි වශයෙන් අපරාධ කෙරෙහි යොමු වී ඇති බවයි. එලෙස අපරාධ කෙරෙහි යොමු වීමට හේතු ලෙස බිඳුනු පවුල් වටපිටාව, අධ්‍යාපනය අඩාල වීම, වැරදි ඇසුර, මත්ද්‍රව්‍ය වලට යොමු වීම, අනිසි දඬුවම සහ ආගමික වටපිටාවෙන් දුරස්වීම යන සාධක අනාවරණය විය. අනාවරණය වූ ඉතා වැදගත්ම සාධකය වූයේ ඔවුන්ගෙන් 86% ක්ම දහම් පාසල් අධ්‍යාපනය හදාරා පැවතීමයි. එහිදි තරඟකාරී විභාග මානසිකත්වය පමණක් දහම් අධ්‍යාපනයේ ඉලක්කය වී ඇති බව අනාවරණය විය. දහම් පාසල් අධ්‍යාපනය බොහෝ විට ආගමික ඉගැන්වීම් වලින් ලබාගත් සදාචාරාත්මක මූලධර්ම අවධාරණය කරන අතර දයානුකම්පාව, අවංකභාවය වැනි සාරධර්ම ඇති කිරීමෙන් ළමුන්ගේ සදාචාරාත්මක වර්ධනය ලඟා කර ගත හැකි බවත්, සම වයස් කණ්ඩායම් කෙරෙහි උපදේශනය ලබා දීම සිදු කිරීම මෙන්ම වගවීම, ස්වයං විනය සහ සංවේදනය පිළිබඳ පාඩම් දහම් අධ්‍යාපනයට ඇතුළත් කිරීමත් සහ ළමුන්ගේ ජීවිතයට වටිනාකම් සහ විශ්වාසයන් පිළිබඳ අවබෝධයක් ලබා දීමෙන් ජීවිතයේ අරමුණ සහ දිශානතිය පිළිබඳ හැඟීමක් වර්ධනය කිරීමට උපකාරී කර ගත හැකි බවත් යෝජනා කරනු ලබයි. කෙසේ වෙතත් ඉරිදා දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කළ යුතු අතරම ඒ සඳහා විභාග ඉලක්ක කරගත් ඉගැන්වීම් ක්‍රම වෙනුවට ප්‍රායෝගික ජීවිතයේ ගුණාත්මකභාවය කෙරෙහි අවධානය යොමු කරමින් ඉගැන්වීම් පරිසරයක් ගොඩ නැංවීම වඩා සුදුසු බවට මෙම පර්යේෂණය හරහා යෝජනා කරනු ලබයි.

මුඛ්‍ය පද :- අවම කිරීම, ඉරිදා දින දහම්පාසල් අධ්‍යාපනය, බාලඅපරාධ, වැදගත්කම

# පුද්ගල පෞරුෂය සංවර්ධනය කරමින් යහපත් සමාජානුයෝගී පුද්ගලයෙක් බිහි කිරීමෙහිලා බුදු දහම තුළින් ලැබෙන පිටිවහල පිළිබඳ මූලාශ්‍රමය අධ්‍යයනයක් (ධම්මපද පාළිය ඇසුරින්)

**ඩී දිලිනි මේනකා**
බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී සිව්වන වසර
නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය
මානෙල්වත්ත, කැලණිය,ශ්‍රී ලංකාව
dilinimenaka123@gmail.com

අප හඳුනාගෙන ඇති අද්විතීය පෞරුෂ ලක්ෂණයන්ගෙන් පරිපූර්ණ උත්තමයා බුදුරජාණන් වහන්සේය. පෞරුෂය සම්බන්ධව සාකච්ඡා කිරීමේ දී එක් එක් පුද්ගලයා අද්විතීය වන්නේ ඔවුන්ගේ පෞරුෂය අනුව වන අතර පෞරුෂය යනු පුද්ගල සමස්තය වශයෙන් දක්වයි. ඒ අනුව පුද්ගලයෙක් තවත් අයෙක් සමග කටයුතු කරන ආකාරය සහ ඔවුන්ට ප්‍රතිචාර දක්වන ආකාරය පුද්ගල පෞරුෂය වශයෙන් හඳුනාගත හැකිය. එමෙන්ම පුද්ගලයා තම පරිසරයට උචිත පරිදි හැඩගැසීමෙහි ක්‍රියාවලිය සමාජානුයෝජනය නම් වන අතර පුද්ගලයා මරණාසන්න මොහොත දක්වාම මෙම ක්‍රියාවලිය සිදු වේ. ඒ අනුව තමා ජීවත්වන සමාජය තුළ උසස් තත්ත්වයක් තමාට ලබා ගත හැකි වන්නේ නිවැරදි ලෙස සමාජානුයෝජනයට ලක් වූ පුද්ගලයෙක්ට පමණී ඒ අනුව පර්යේෂණ ගැටලුව වනුයේ පුද්ගල පෞරුෂය සංවර්ධනය කරමින් යහපත් සමාජානුයෝගී පුද්ගලයෙක් බිහි කිරීමෙහිලා බුදු දහම තුලින් ලැබෙන පිටිවහල කවරේද? යන්නයි. මෙම පර්යේෂණය හරහා පුද්ගලයාගේ පෞරුෂය සංවර්ධනය කරමින් යහපත් ලෙස සමාජගත වූ පුද්ගලයෙක් බිහි කිරීමෙහිලා බුදු දහම තුලින් ලැබෙන පිටිවහල පිළිබඳ ධම්මපදයෙහි තෝරාගත් වග්ග ඇසුරෙන් මූලාශ්‍රයමය අධ්‍යයනයක් සිදු කිරීම අරමුණ වේ. සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථයක් වශයෙන් ධම්මපද පාළිය හඳුනාගත හැකි අතර ආගම් හා සංස්කෘතිකමය භේදයකින් තොරව පුද්ගලයාගේ සංවර්ධනය උදෙසා නිර්මාණය කරන ලද ග්‍රන්ථයක් වශයෙන් ප්‍රචලිතය. පුද්ගල පෞරුෂය සංවර්ධනය උදෙසා ධම්මපදයෙන් ලැබෙන පිටිවහල පිළිබඳව සාකච්ඡා කිරීමේ දී අපගේ මෙලොව සහ පරලොව යන දෙඅංශයෙන්ම දියුණුව කෙරෙහි තමන්ගේ පෞරුෂය සංවර්ධනය කරගත යුතු ආකාරය විස්තර කරයි. එමෙන්ම ධම්මපද පාළිය තුළ දැකගත හැකි තවත් එක්තරා සුවිශේෂී ලක්ෂණයක් වන්නේ තමන්ගේ දියුණුව කෙරෙහි පමණක් නොව අනුන්ගේ දියුණුව කෙරෙහි ද සම සිතැති ව තමන් තුළ පෞරුෂ ගුණාංග සංවර්ධනය කරගත යුතු බව අවධාරණය කිරීමයි. මෙහිදී පුද්ගලයාගේ සිතිවිලි නිවැරදි ලෙස හසුරුවා ගත යුතු ආකාරය, බාධා ඉදිරියේ නොසැලී සිටීම, සිහිය පවත්වා ගැනීම, වෛර කිරීම් කලහ කිරීම් වලින් වැළකීම, නොසැලෙන බව ,අධිෂ්ඨානශීලී බව, ඉවසීම, නිවැරදි දැකීම සහ නිවැරදි ක්‍රියා සිදුකිරීම, නුවණැති බව ආදී වශයෙන් පෞරුෂයත්ව ගුණාංග රාශියක් යමක,අප්පමාද,චිත්ත,බාල,පණ්ඩිත,දණ්ඩ,අත්ත,පිය යන වග්ග වල දක්වා ඇත. එම ගුණාංග භාවිත කරමින් පුද්ගලයෙකු යහපත් ලෙසින් සමාජගත කිරීමක් සිදුකිරීමට දරන ලද උත්සාහයක් වශයෙන් ධම්මපද පාළිය හඳුනාගත හැකිය. ඒ අනුව මෙම අධ්‍යයනය තුළදී මාගේ නිගමනය වන්නේ පුද්ගලයාගේ පෞරුෂය සංවර්ධනය කරමින් යහපත් සමාජානුයෝජන ක්‍රියාවලියක් උදෙසා ධම්මපද පාළිය තුළින් ඍජු බලපෑමක් ඇති කරන බවයි.

**ප්‍රමුඛ පද :** පෞරුෂය, සමාජානුයෝජනය, ධම්මපදය, පුද්ගල සංවර්ධනය

# ධාර්මික නායකයෙකුගේ ගුණාංග පිළිබඳව බෞද්ධ විග්‍රහය ගැන විමර්ශනාත්මක අධ්‍යයනයක්

**එල්.ඒ.ආර්.එස්.එන්.ලියනආරච්චි**
ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය
shanikanethminiliyanaarachchi@gmail.com

අනුගාමිකයන් පිරිසක් කිසියම් අරමුණක් කරා පමුණුවන  යන අර්ථයෙන් නායකයා නම් වන්නේය. එනම්, නිශ්චිත අරමුණක් සාක්ෂාත් කර ගැනීම සඳහා පිරිසක් මෙහෙයවන්නා නායකයෙකි. නායකයා වූ කලී අයුක්තිය අසාධාරණය පිට දැක යුක්තිය හා සාධාරණය මත ක්‍රියා කරන්නෙකි. මේ අනුව මෙම පර්යේෂණයෙහි ගැටලුව වන්නේ ධාර්මික නායකයෙකු සතු ගුණාංග පිළිබඳ බෞද්ධ විග්‍රහය කෙබඳු ද යන්න විමර්ශනය කිරීමයි. ධාර්මික නායකයෙකු සතු ගුණාංග පිළිබඳව බෞද්ධ විග්‍රහය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙහි මූලික අරමුණ වේ. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ මූලික වශයෙන් සූත්‍ර පිටකය හා විනය පිටකය යන පිටක ග්‍රන්ථ ප්‍රාථමික මූලාශ්‍ර ලෙසත්, විද්වත් ග්‍රන්ථ හා ලිපි යනාදිය  ද්විතීයක මූලාශ්‍ර ලෙසත් යොදාගනිමින් මෙම පර්යේෂණ ගැටලුව හා සම්බන්ධ දත්ත සන්ධාර දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය යටතේ සිදු කරමින් මෙම පර්යේෂණය කර ඇත. චක්කවත්තිසීහනාද සූත්‍රය, සිගාලක සූත්‍රය, මහාපරිනිබ්බාන සූත්‍රය හා කූටදන්ත සූත්‍රය යනාදි සූත්‍ර මඟින් බුදුන් වහන්සේ පෙන්වා දුන් ධාර්මික නායකයෙකු සතු ගුණාංග මැනවින් ප්‍රකට වේ. යහපත් වූ ධාර්මික නායකයකු බිහිවීම සඳහා ප්‍රායෝගිකව අනුගමනය කළ හැකි නායකත්ව ගුණාංග රැසක් බුදුන් වහන්සේ පෙන්වා දී ඇත. ඒවා දස රාජධර්ම, සතර සංග්‍රහ වස්තු, සප්ත අපරිහානි ධර්ම, දස සක්විත්වත්, ආදී ලෙසින් දැක්විය හැකිය. මේ අයුරින් බුදුන් වහන්සේ රජවරුන්ට පවා තම රාජ්‍ය මනා කළමනාකාරීත්වයකින්  යුතුව සිදුකරගෙන යාමට අවශ්‍ය පිළිවෙත් දේශනා කොට ඇත. කිසියම් රටක පාලනය මනා කළමනාකාරීත්වයකින්  යුතුව පවතිනුයේ එහි නායකත්වයේ පවතින යහපත්භාවය නිසාය. එමෙන්ම රටක ආර්ථික හා දේශපාලනික සංස්ථා ගොඩනැගීමට මෙන්ම සමාජයීය වශයෙන් පුද්ගල ආකල්ප වර්ධනය කිරීමට රටකට උදාර නායකත්වයක් අවශ්‍යය. එමෙන්ම නායකයා වූ කලි දූරදර්ශී විය යුතුය. බුදුන් වහන්සේ වූ කලි පරමාදර්ශී නායකයෙකි. ආරම්භයේදී පස්වග මහණුන්ගෙන් ඇරඹි බුදු සසුන ඉතා කෙටි කලක දී විශාල ශ්‍රාවක පිරිසක් කරගන්නට උන්වහන්සේගේ උදාරතර නායකත්ව ගුණාංග නිසා හැකියාව ලැබුණි බුදුන් වහන්සේ ප්‍රථම රහත් 60 නම අමතා කරන ලද අවවාදය නායකයකු ලෙස මානව සම්පත් කළමනාකරණයේ උන්වහන්සේ තුළ පැවති ශක්‍යතාවය පිළිඹිබු කරයි. " මහණෙනි බොහෝ ජනයාගේ හිත සුව පිණිස ධර්ම චාරිකාවේ හැසිරෙන්න, දෙදෙනෙකු එක මඟ නොයන්න, මුල, මැද, අග අර්ථ සහිත වූ ධර්මයක් දේශනා කරන්න" මෙමඟින් උන්වහන්සේ පෙන්වා දී ඇත්තේ නායකයා වූ කලි මානව සම්පත් කළමනාකරුවකු විය යුතු බවයි. නමුත් වත්මන් නායකයන් අතින් ගිලිහී යන ප්‍රධාන කරුණක් වන්නේ නිසි ආකාර මානව සම්පත් කළමනාකරණයක් සිදු කරගත නොහැකි වීමයි. යථාවාදී තථාකාරී, යථාකාරී තථාවාදී ගුණය මගින් බුදුන් වහන්සේ විශිෂ්ට නායකත්වයක් සැපයූ බවත්, අභියෝගවලට නොබියව මුහුණ දීමේ අසමසම හැකියාව හා නිහතමානී බව යනාදි ගුණාංගයන් ධාර්මික නායකයෙකු සතුව තිබෙන ගුණාංග බව බෞද්ධ ඉගැන්වීම් මඟින් ගම්‍ය වේ. සමස්තයක් ලෙස ගත්කළ මෙමඟින් බුදු දහම තුළ ප්‍රකට ධාර්මික නායකයෙකු සතු ගුණාංග කෙබඳු ද පිළිබඳවත්, එම ගුණාංග වර්තමානය තුළ ප්‍රායෝගිකව භාවිතා කිරීම තුළින් සමාජ, ආර්ථික හා දේශපාලනික වශයෙන් යහපත් තත්ත්වයකට පත්විය හැකි බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පදඃ ගුණාංග, නායකත්වය, ධාර්මික,  බුදුන් වහන්සේ, බෞද්ධ ඉගැන්වීම්

# අවිධිමත් රාජ්‍ය පාලනයකින් ප්‍රජා ආර්ථිකය පිරිහීමට හේතු වේ

**ඒ .කේ . මධුෂිකා ශිවංගී**
ආර්ථික විද්‍යා විශේෂවේදී ( දෙවෙන වසර ) ආර්ථික විද්‍යා අධ්‍යන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය. ssh2020441@ssh.rjt.ac.lk

**ටී.එම්.එන්.මදූසානි**
ආර්ථික විද්‍යා විශේෂවේදී ( දෙවෙන වසර ) ආර්ථික විද්‍යා අධ්‍යන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය. ssh2020271@ssh.rjt.ac.lk

රටක පාලකයාගේ ප්‍රධාන ම කාර්යභාරය වන්නේ රට ස්වයං පෝෂිත කරවමින් නීතියලසදාචාරයල සමාජය හා සහජීවනය ඇති වන අයුරින් රාජ්‍ය පාලනය කිරීම ඔහුගේ වගකීම වේග ආර්ථිකය යනු පුද්ගලයාට අත්‍යවශ්‍ය සාධකයක් වන අතර ප්‍රජාව ආර්ථිකයෙන් පොහොසත් නොවීම සමස්ත රාජ්‍ය පාලනයටම බලපායිග යම් කිසි හේතුවකින් ප්‍රජා ආර්ථිකය පිරිහු විට නැවත යාවත්කාලින කිරීම රාජ්‍ය පාලකයකුගේ වගකීම වේ. ඉහත කී ප්‍රජා ආර්ථිකය පිරිහීමට ප්‍රධාන ම හේතුව අවිධිමත් රාජ්‍ය පාලනය බලපාන්නේ කෙසේදැයි විමසා බැලීම මෙහි පර්යේෂණ ගැටලුව යි. එකී ප්‍රජා ආර්ථිකය ශක්තිමත් කරවීමට රාජ්‍ය පාලකයා සතුව තිබිය යුතු කාර්යභාරය පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වේග තුලනාත්මකව පර්යේෂණ ක්‍රමවේදය මෙහිලා භාවිතා කළ අතර ඒ හා සම්බන්ධව රචනා වී ඇති පැරණි මූලාශ්‍ර මෙන්ම ශාස්ත්‍රිය ලේඛන ද පරිශිලනය කෙරිණිග ශ්‍රී ලංකාව තුළ දැනට උද්ගතවී ඇති ආර්ථික පිරිහීමට ප්‍රධානම වශයෙන් පාලකයාගේ අත්තනෝමතික දේශපාලන තීන්දු තීරණ හේතු වී ඇති බව පෙනේ. රටෙහි පවතින ආර්ථිකයට වඩා වැඩි ප්‍රමාණයක් විදේශීය ණය ලබාගැනීම ද දේශපාලනික හිතවතුන්ගේ මැදිහත් වීම නිසාත් පවතින ආර්ථික ක්‍රමය විනාශ වීමට හේතු වී ඇත. රටේ ජනයාගේ බදු මුදලින් තමාගේ සුඛ විහරණය පිණිස ක්‍රියාකොට ආර්ථික සමෘද්ධියක් රට තුළ ස්ථාපනය නොකට, රැකියා අහිමි කොට, බඩුමිල වැඩි කොට හා අසාධාරණ ලෙස අයබදු ගැනීම නිසා රට පුරාම සොරකම්, මංකොල්ලකෑම් සිදුවන බව දීඝ නිකාය කූටදන්ත සූත්‍රයෙහි පැහැදිලිව ම සඳහන් කොට ඇත. මේ සඳහා පාලකයා විසින් බෝග වගාකරන්නන්ට බෝග ලබා දීම "බීජභත්තං අනුප්පදාසි", වෙළඳ භාණ්ඩවලට නිසි මිලක් ලබා දීම"පාභතං අනුප්පදාසි", රාජ්‍ය සේවකයාට නිසි වැටුපක් ලබා දීම " භත්ත වේත්තං පකප්පෙසි" තුළින් ප්‍රජාව රට විනාශ නොකර කර්මාන්ත කරමින්, අයබඳු ගෙවමින් අඹු දරුවන් හා සතුටින් වාසය කරන නිසා ආර්ථිකය පිරිහිමට පත් නොවන බව සනාථ ය. ඉහත කී කරුණු සළකා බැලිමෙ දී ආර්ථික වැනි ඕනෑම අර්බුදයක් ජයගෙන රට ස්වයං පෝෂිත කරමින් කිසිවෙකුට හිංසාවක් නොවන අයුරින් ආදායම් බෙදි යන පරිදි ඉවසීමෙන් හා දූරදර්ශි සැලසුම් සකස් කිරිමෙන් පමණක් ප්‍රජා ආර්ථිකය ශක්තිමත් කිරීමට හැකියාවක් පවතින බව සනාථ වේ.

**යතුරු පදඃ** පාලකයා, රාජ්‍ය පාලනය, ප්‍රජා ආර්ථිකය, පිරිහීමට, අයබදු

# An investigation on the humanistic punishment system depicted in Kesi Sutta of Aṅguttara Nikāya

**Ven.Polonnaruwe Kashyapa**
Pali Special (second year) - Department of Pali and Buddhist studies,
Bhiksu University of Sri Lanka.
bs597@busl.ac.lk

Sutherland, a Westerner, has presented four principles of crime prevention, and he states that punishment is an essential part of crime. It means that punishment is the central factor in the subject of crime prevention in the Western legal system. But the punishments shown in the Buddhist discipline are humanistic. Although, the Buddha introduced the punishment system to the community of monks (saṅgha), all of them can be applied to the well-being of the entire society. The research problem here is that the criminal is motivated to commit more crimes through the current punishment system, and as an answer to that, the research objective is to conduct a study on the ability to direct him to the right path through the humane punishment system taught in Buddhism The research paper is based on qualitative research methodology here and a balanced study of the facts obtained from other related academic articles and old sources were done. The process followed by The Buddha to set criminals on the right path can be well understood through facts given in **Kesi Sutta** of **Aṅguttara Nikāya** as ***saṇhena, pharusena, saṇhapharusena, hanena***. The method of "***saṇhena***" is to discipline a person by exhorting him about the good physical and mental actions and their consequences. The method of "***pharusena***" is to point out the harm caused by physical, verbal and mental immorality and its negative results. If he cannot be disciplined by both ***saṇhapharusena***, these methods, he should not be admonished, and then he is considered as having done and dismissed, which is called "***hanana***". Thus, the punishment system of Buddhism is humanistic. Therefore, Buddhist punishment system can be applied to the benefit of the entire mankind and to prevent crimes.

**Keywords**: *crime, punishment, discipline, humanistic, Kesi Sutta*

# පුරාණ ථේරවාදි මහාවිහාරීය භික්ෂු අධ්‍යාපනයේ භාවිතය වත්මන් භික්ෂු අධ්‍යාපනය විෂයෙහි උපයෝගී කරගත හැකි අන්දම පිළිබඳ විමසුමක්.

**පූජ්‍ය කැලණියේ ධම්මගවේසී හිමි**
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය
නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය - කැලණිය
kelaniyedhammagavesi@gmail.com

වත්මන් භික්ෂු අධ්‍යාපනය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී එය පිරිවෙන් අධ්‍යාපනය හා විශ්ව විද්‍යාලීය අධ්‍යාපනය හා ආගමික අධ්‍යාපනය වශයෙන් විකාශනය වී ඇති බව දක්නට ලැබේ. අනුරාධපුර යුගයේ පුරාණ මහාවිහාරිය අධ්‍යාපන ක්‍රමය පෙළ අටුවා හා ටීකා ඔස්සේ ආචාර්ය ප්‍රවේණිගත පරම්පරා ඔස්සේ සංවර්ධනය වී ඇත. එමගින් අතීත භික්ෂූන්ගේ ධර්ම විනය, භාෂා ශබ්ද ශාස්ත්‍ර විෂයෙහි පැවති මනා පෘථුල බවක් විශද විය. මිහිඳු මහරහතන් වහන්සේ විසින් ආරම්භ කරන ලද ථේරවාදී මහා විහාරීය සම්ප්‍රදාය පශ්චාත් කාලීනව වෛතුල්‍යවාදී අදහස් පැමිණීම හේතුකොට ගෙන යම්තාක් දුරට පරිහානියට පත් විය. මෙවැනි සාධක හා වෙනත් සමාජීය හේතු පදනම් කොටගෙන මහා විහාරීය අධ්‍යාපන ක්‍රමයේ අතීත මුහුණුවර වෙනස් වී වර්තමාන භික්ෂු අධ්‍යාපන ඊට හාත්පසින්ම වෙනස් අයුරකින් දැක ගත හැකි වේ. මෙහිලා පර්යේෂණ ගැටලුව වනුයේ පුරාණ මහාවිහාරිය පෙළ, අටුවා, ටීකා අධ්‍යයනය සමස්ත භික්ෂු අධ්‍යාපනය විෂයෙහිලා උපස්ථම්භක නොවීමත් ලෞකික විෂයන් හා බද්ධව පැවතීම හේතුවෙන් ත්‍රිපිටක අධ්‍යාපනය විෂයෙහි ප්‍රමුඛස්ථානයක් ලබා නොදීමයි. මාහාවිහාරීය අධ්‍යාපනය අනුව පාලි භාෂාව හා ත්‍රිපිටක ධර්මය ආශ්‍රිතව වචනයක් වචනයක් පාසා භාෂා නිරුක්ති අර්ථ විෂයෙහි ප්‍රවීණයන් වූ ආචාර්යවරු මධ්‍යයෙහි ඉගෙනීම සිදුකොට ඇත. මෙම තත්වය ඔස්සේ පිරිවෙන් විශ්ව විද්‍යාල බවට පත් වීම හේතුකොටගෙන භික්ෂු අධ්‍යාපනය ආරාමික අධ්‍යාපන ක්‍රමයෙන් බැහැරව වෙනත් ක්‍රමවේද ඔස්සේ බටහිර ක්‍රමය හා මුසුවිය. එමඟින් ආරාමික අධ්‍යාපන ක්‍රමයේ බිඳවැටීමත් සමඟ භික්ෂු අධ්‍යාපන බටහිර අධ්‍යාපන ක්‍රමයේ තවත් එක් ස්ථරයක් බවට ආරම්භ විය. ඇතැම් ආරාණ්‍ය සම්ප්‍රදායන්හි මහාවිහාරීය ලක්ෂණ දක්නට ලැබෙන අතර ආරාමීය අධ්‍යාපන ක්‍රමයේ වැදගත් බව ගම්‍යමාන වෙමින් පවතී. සූත්‍ර, විනය, අභිධර්මය පිටකත්‍රය හා පාලි භාෂාව මෙන් අනෙකුත් ශබ්ද ශාස්ත්‍ර ගුරු ඇසුරෙන් සිදුකරමින් වර්තමානයේ ආරණ්‍ය භික්ෂු අධ්‍යාපන ක්‍රියාත්මක වේ. මූලික වශයෙන් ත්‍රිපිටක පෙළ අටුවා භාවිතය ඔස්සේ ආරාමීය භික්ෂු අධ්‍යාපන ක්‍රමය සංවර්ධනය විය යුතු අතර ඒ අනුව එය උපයෝගී කරගත හැක්කේ කෙසේද යන්න මෙහිලා අධ්‍යයනයට ලක් වේ. පරියත්ති, පටිපත්ති, පටිවේධ යන ත්‍රිවිධ ශාසන භික්ෂුවගේ අධ්‍යාත්මය උදෙසා පෙරමුණගැනීමට මහාවිහාරීය ලක්ෂණ තවදුරටත් භික්ෂු සංස්ථාවේ ස්ථාපනය කළ යුතු බවට මෙම අධ්‍යයනයේ දී තහවුරු විය.

**මුඛ්‍ය පදය :-** අධ්‍යාපනය, ආරණ්‍ය, ථේරවාදය, භික්ෂු, මහා විහාරය

# චරණ ක්‍රියාවලියෙහිලා භික්ෂු විනය ශික්ෂාවන්හි උපයෝගීතාවය පිළිබඳ අධ්‍යයනයක්

**පූජ්‍ය කැලණිය ධම්මගවේසී හිමි**
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය -
නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය - කැලණිය
kelaniyedhammagavesi@gmail.com

බුදුසමයේ දක්වා ඇති මැදුම් පිළිවෙතෙහි ශීලය යනු පූර්වංගම ප්‍රතිපදාවයි. කායික වාචසික සංවරය ශීලය ලෙස ව්‍යවහාර වන අතර, සික්ෂාපදය පුද්ගලයාගේ ආධ්‍යාත්මය උදෙසා සිදු කෙරෙන උපදේශාත්මක ස්වභාවයක් විමර්ශනය වන බව ප්‍රකට වේ. භික්ෂු විනය ශික්ෂාපද අධ්‍යයනයේදී මූලික වශයෙන් භික්ෂූන්හට සික්ෂාපද 227ක් හා භික්ෂුනින්ට සික්ෂාපද 311 පණවා ඇති බව දක්නට ලැබේ. චතුපාරිශුද්ධ ශීලය ශීල අතුරින් උසස්ම ශීලය වන අතර එහි ප්‍රාතිමෝක්ෂ සංවර සීලය ශික්ෂාපද ශීලයයි. ප්‍රමුඛාර්ථයෙන් උසස් ස්වභාවයෙහිලා ගැනෙන ශීලය හා ශ්ක්ෂාව යන පද දෙකෙන් එකම අර්ථයක් ගම්‍යමාන වන්නේ ද නැතහොත් අර්ථ ද්විත්වයක් ගම්‍යමාන වේද යන්න මෙහිලා අධ්‍යයනයට ලක්වන ගැටලුවයි. භික්ෂු සමාජය ශීලයෙන් හා ශික්ෂාවෙන් පිරිහීයන බවත් පෙනෙන වත්මනෙහි භික්ෂූන් වහන්සේලා තුළ විනය උද්දීපනයක් හා විනයේ ප්‍රකටීභූත බවත් උසස් සමාජයක අයශ්‍යතාවය පෙන්වා දීම මෙහිලා අරමුණ වේ. පාරිජිකා, සංඝාදිසේස ආදී ගරු ඇවැත් විනිර්මුක්තව විනයේ ගරුතැන පිහිටා කටයුතු කරන භික්ෂු සමාජයක අවශ්‍යතාව වර්තමානයේ තදින්ම බලපවත්නා වූ කතිකාවකි. ශික්ෂාපද පඤ්ඤප්තීන්හී උපයෝගීතාව ඔස්සේ භික්ෂු විනය ප්‍රවර්ධනය කෙතෙක් දුරට වර්තමාන සංඝ සංස්ථාවට අවබෝධාත්මකව ලබාදීමට විශේෂිත වූ කරුණු කාරණා රාශියක් සමාජගත කළ යුතු වේ. ලෞකික ලෝකෝත්තර අර්ථ සාධනය උදෙසා ශීලය වැදගත් කාර්‍යභාරයක් ඉටු කරන බැවින් අභ්‍යන්තර ශික්ෂණය සඳහා භික්ෂූන් හට ශික්ෂාපද පැණවීම ගෞතම බුද්ධ සාසනය චිරස්ථායී වීම සඳහා ප්‍රමුඛ සාධකයක් වන බව පාරාජිකා පාළියේ වේරංජ කාණ්ඩය ඔස්සේ අනාවරණය වේ. පර්යේෂණ අධ්‍යයනයේදී මූලික වශයෙන් මූලාශ්‍රය භාවිතා කළ අතර එහිලා විනය මාතිකා, බුද්ධානු බුද්දක සික්ෂාපද, විනය ක්‍රම ඔස්සේ ද, වෘද්ධ විනයධර භික්ෂූන්ගේ විනය අධ්‍යාශය කෙබඳු ස්වරූපයකින් ඉදිරිපත් වන්නේ ද යන්න ගවේෂණය කරන ලදී. ඒ සඳහා විධිමත් අයුරින් විනය පෙළ අටුවාව හා ටීකාව උපයෝගී කරගන්නා ලදී. පුද්ගලයාගේ ආචාරධර්ම ක්‍රියාවලිය උදෙසා කායික වාචසික ක්‍රියාකාරිත්වය මෙන් ම මානසිකමය වශයෙන් චක්‍රාකාරව ද ශීලය හා ශික්ෂාව වැදගත් වේ. ඒ පිළිබඳව විනය සප්තදශාකාරයෙන් ද ස්ථුට වේ. බුද්ධකාලයෙන් ඊට පෙරත් ශීලය හා ශික්ෂාව භාරතීය ආගමික සම්ප්‍රදායන් තුළ පැවතුණු අතර මහාමායා දේවිය සිද්ධාර්ථ කුමරුන් පිළිසිඳ ගැනීමට පෙර සීලමය වශයෙන් පාරිශුද්ධියට පත් වී තිබූ බව සිහිපත් කළ යුතුය. එලෙසින් ප්‍රතිපත්ති මාර්ගයෙහි සීලය අන් ශික්ෂාවන්ට ද පදනම වනුයේ එබැවිනි. භික්ෂු විනයෙහිලා ප්‍රාතිමෝක්ෂ සංඛ්‍යාත උපසම්පදා ශීලයෙහි උපයෝගීතාව ඔස්සේ භික්ෂුත්වයට කිනම් අයුරකින් ශීලය හා සික්ෂාපද වැදගත් වන්නේද යන්නත් විමුක්ති සාධනයෙහිලා වඩාත් ප්‍රබල වනුයේ ශීලය ද නැතහොත් ශික්ෂාව ද යන්න අධ්‍යයනයට ලක්කිරීමේ දී මෙම සාධක ද්විත්වය සාර්ථක භික්ෂු ජීවිතයක් ගොඩනැංවීමෙහිලා උපයෝගී වන බව මෙම අධ්‍යයනයේදී අනාවරණය විය.

**ප්‍රමුඛ පද :-** භික්ෂු විනය, ප්‍රතිමොක්ෂ සංවර සීලය, උපසම්පදාව, බෞද්ධ ප්‍රතිපදාව, ශික්ෂාව)

# බුදු දහමෙහි ප්‍රකට වන මානසික රෝග පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක්

**කේ.ඩබ්ලිව්.ඩී.නුජිත**
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය,
රුහුණ විශ්වවිද්‍යාලය
nujithadulith@gmail.com

බුදු දහම යනු මනස මූලික කරගත් යථාර්ථවාදී ජීවන දර්ශනයකි. බුදු දහමේ මූලික පරමාර්ථය වන්නේ ලෝ සත්ත්වයා සසර දුකින් මුදවා නිවන් අවබෝධ කරවීමයි. නමුත් නිවන් අවබෝධ කර ගන්නා තෙක් සිය ජීවත කාලයේ දී කායික හා මානසික වශයෙන් ගැටළු රාශියකට මුහුණ පෑමට ඔහුට සිදුවේ. බුදුන් වහන්සේ නීරෝගීකම උතුම් ම ලාභය ලෙස වදාළහ(ආරොගයා පරමා ලාභා). බුදුන් වහන්සේ අං.නි. රෝග සූත්‍රය මගින් පුද්ගලයාට වැළදෙන රෝග වර්ග දෙකක් පෙන්වා දී ඇත. එනම්, කායික හා මානසික වශයෙනි. නමුත් පෘථග්ජන පුද්ගලයාට කායික රෝග තුළින් මිදි බොහෝ කාලයක් සිටිය හැකි නමුත් මානසිකව ඇති වෙන රෝග තුළින් මිදි සිටීම අපහසුය. බුදුන් වහන්සේ සිය දේශනා මගින් පෙන්වා දී ඇත්තේ මානසික රෝග සඳහා කරුණු තුනක් බලපාන බවයි. එනම්, ලෝභ, ද්වේෂ හා මෝහ යනුවෙනි. මෙම කරුණු තුන අකුසල මූල ලෙස හඳුන්වා ඇත. පුද්ගලයා තුළ මෙම අකුසල මූල සංවර්ධන වීමෙන් මානසික වශයෙන් පීඩාවට පත්වෙන බව බුදුන් වහන්සේ දේශනා කර ඇත. කෙසේ නමුත් ආර්යයන් වහන්සේලා තුළ මානසික වශයෙන් රෝග හටනොගන්නා බව බුද්ධ දේශනා තුළින් ප්‍රකට වේ. ඊට හේතුව වන්නේ උන්වහන්සේලා ලෝභ, ද්වේෂ හා මෝහ යන අකුසල ධර්ම සම්පූර්ණයෙන්ම ප්‍රහාණය කර ඇති බැවිනි. මේ අනුව මෙම පර්යේෂණයෙහි ගැටළුව වන්නේ බුදු දහම තුළ ප්‍රකට වන මානසික රෝග මොනවාද යන්න විමර්ශනය කිරීමයි. බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලද දේශනාවන්හි ප්‍රකට වන පුද්ගලානුබද්ධව හටගන්නා මානසික රෝග විශ්ලේෂණය කර අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙහි අරමුණ වේ. මූලික වශයෙන් සූත්‍ර පිටකය ප්‍රාථමික මූලාශ්‍රය ලෙසත් විද්වත් ග්‍රන්ථ, ලිපි හා අන්තර්ජාලය ආශ්‍රිත තොරතුරු ද්විතීයක මූලාශ්‍ර ලෙසත් යොදාගෙන මෙම පර්යේෂණ ගැටළුව හා සම්බන්ධ දත්ත විශ්ලේෂණය කරමින් මෙම පර්යේෂණය සිදු කර ඇත. පුද්ගලයා තුළ ඇති වන මානසික ගැටළු සම්පූර්ණයෙන්ම සුව කර ගැනීමට නම් අකුසල මූල ප්‍රහාණය කල යුතු වේ. තවද බුදු දහම තුළ විවිධ මනෝ භාවයන්ට අදාළ පුද්ගල චරිත හයක් හඳුන්වා ඊට අදාළ මානසික ගැටළු පෙන්වා දී ඇත. ලෝභය, ද්වේෂය හා මෝහය සංවර්ධන වීමෙන් හටගන්නා අභිජ්ජා, ව්‍යාපාද, මිථ්‍යා දෘෂ්ටි යන සංවර්ධිත අවස්ථා මගින් මානසික රෝග ඇති වෙන බවත්, පුද්ගල සිත තුළ කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච හා විචිකිච්ඡා යන නීවරණ ධර්ම මානසිකව පීඩා විඳීමට මුල් වෙන බවත්, සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස යනාදී දස සංයෝජන මානසික රෝග ගණයෙහි ලා සැලකෙන බවත්, ම.නි. සල්ලේඛ සූත්‍රයෙහි මිනිස් සිතෙහි හටගැනෙන රෝග 44ක් දැක්වෙන බවත් යනාදීය පෙන්වා දීම මෙමගින් ප්‍රකට වෙන ප්‍රතිඵල වේ. මේ අනුව පුද්ගලානුබද්ධව ලෝභ, ද්වේශ හා මෝහ යන අකුසල ධර්ම අඩු වැඩි වශයෙන් පැවතීම මගින් මානසික රෝග ඇති වන බව බුදුන් වහන්සේ සිය දේශනා මගින් දක්වා ඇති බව මනා නිගමනයකට එළඹිය හැකිය.

ප්‍රමුඛ පදඃ අකුසල මූල, පුද්ගලයා, බුද්ධ දේශනා, මානසික, රෝග

# ගැටුම් නිරාකරණය සඳහා වූ බෞද්ධ ප්‍රතිපදාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**ඒ.කේ.සී. අයේෂානි අබේසිංහ**
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, බෞද්ධ අධ්‍යයන පීඨය,
නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, කැලණිය.
chamoayesha9653@gmail.com

'ගැටුම' වර්තමාන සමාජ ප්‍රශ්නයකි. එය ප්‍රබල හා සංකීර්ණ ප්‍රස්තුතයකි. ගැටුමක ස්වභාවය හා ගැටුම් නිරාකරණය පිළිබඳව විවිධ ආගමික හා සමාජ පසුතල ඔස්සේ සාකච්ඡාවට බඳුන්වන වටපිටාවක් වර්තමානය තුළ පවතී. එයට ප්‍රධාන හේතුවක් වනුයේ මෙම යුගයේ පවතින ගැටුම් මත පදනම්ව ගොඩනැගුණු සමාජ පසුබිමයි. ගැටුමක ස්වභාවය හා ගැටුම් නිරාකරණය පිළිබඳව බුදුදහමේ ආකල්පය කවරාකාර ද යන්න විමසීම අරමුණු කරගත් මෙම පර්යේෂණයේ දී ගැටුම් නිරාකරණයට බුදුදහම සාර්ථක පිළිතුරක් ලබාදේ ද යන්න පරීක්ෂා කිරීම සිදු වේ. එහි දී ත්‍රිපිටක ග්‍රන්ථ ප්‍රධාන ප්‍රාථමික මූලාශ්‍රය කොටගෙන තදානුබද්ධ ද්විතීක මූලාශ්‍රය ද යොදා ගනිමින් සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය කිරීමේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ මෙම පර්යේෂණය සිදු කෙරේ. යම් ප්‍රස්තුතයක් පිළිබඳව දෙදෙනෙකු අතර හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හෝ කණ්ඩායම් දෙකක් අතර ඇතිවන අවබෝධයේ නොගැලපීම ගැටුමක් යනුවෙන් අර්ථ දැක්විය හැකිය. මෙම ගැටුම මතවාදීමය වශයෙන් හෝ ප්‍රතිපත්තිමය වශයෙන් වූ වෙනසක් පාදක කොට ගොඩනැගුණද එය ප්‍රබල විසංවාදයක් බවට පත්ව බල අරගලයක් බවට පත්වීමේ ශක්‍යතාවක් පවතී. බුදුදහම යම් ප්‍රස්තුතයක් නැවැත්වීම හෝ වැළැක්වීම සම්බන්ධව දක්වන අදහස වනුයේ ඵලය නැසීම හෝ වැළැක්වීමට කටයුතු කිරීම නොව ඵල උත්පාදනයට මූල බීජය වූ හේතු කාරක ධර්මයන් විනාශ කිරීම හෝ වැළැක්වීමයි. පුද්ගල චින්තනය කේන්ද්‍ර කොටගෙන වාද විවාද වලට හා ගැටුම්කාරී තත්ත්වයන්ට අදාළ පසුබිම සකස් වේ. ඒ අනුව පුද්ගලබද්ධ හා මානසික වශයෙන් දෙයාකාර වූ ගැටුම් ඇතිවීමට සඤ්ඤාව හා දිට්ඨිය මූලික කොටගත් ක්ලේශ ධර්මයන් ඉවහල් වේ. මෙලෙස ක්ලේශ ධර්මයන්හි ස්වභාවය අවබෝධකොට අභිමතාර්ථ සාධනයෙහිලා කටයුතු කිරීම ගැටුම් නිරාකරණය කිරීමෙහිලා බුදුදහම ලබා දෙන මාර්ගෝපදේශය යි. ඒ අනුව අවස්ථානුකූලව යොදා ගන්නා තාවකාලික පිළියම් බුදුදහමට ආධුනික ය. තාවකාලික විසඳුම් වලට නොඑළඹී ගැටුම් මූලය හඳුනාගෙන එම මූලයට පිළියම් කිරීම බුදුදහමේ ස්ථාවරත්වය යි. ගැටුම හා ගැටුම් නිරාකරණය සම්බන්ධයෙන් දක්නට ලැබෙන වර්තමාන වෙනත් එළඹුම් අතර බුදුදහමෙන් ඉදිරිපත් කෙරෙන නිර්දේශයන්හි විශේෂත්වය වන්නේ ද ගැටුම් මූලය හඳුනාගෙන එම මූලයට පිළියම් කිරීම යි. මෙහි දී චතුරාර්ය සත්‍ය ඉගැන්වීම, පංච නීවරණ, සීලය ආදී සංකල්ප ඔස්සේ මධුපිණ්ඩික සූත්‍රය, මාගන්දිය සූත්‍රය, කලහවිවාද සූත්‍රය, සංගීති සූත්‍රය හා සබ්බාසව ආදී සූත්‍ර දේශනාවන් පාදක කොට බුදුදහමේ ගැටුම් නිරාකරණය සම්බන්ධව විවරණය කළ හැකිය. ගැටුම් නිරාකරණය සම්බන්ධයෙන් බුදුදහම තාර්කික, සාධනීය මෙන්ම ස්ථිරසාර විසඳුම් ලබා දීමට සමත් බව මෙමගින් නිගමනය කළ හැකි අතර ගැටුම් නිරාකරණය කරගැනීම පුද්ගලාභිවෘද්ධිය මෙන්ම සමාජාභිවෘද්ධියට ද ඉවහල් වන බව පෙන්වාදිය හැකිය.

**ප්‍රමුඛ පද :** අභිවෘද්ධිය, ගැටුම, ගැටුම් නිරාකරණය, ගැටුම් මූලය, බුදුදහම

# බුද්ධ චරිතයෙන් පිළිඹිබු වන නායකත්ව ලක්ෂණ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**රාජපක්ෂ, ඩබ්ලිව්.ඒ.එන්.එම්.**
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, මානවශාස්ත්‍ර පීඨය,
කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
nadeeshar85@gmail.com

යම් ඉලක්කයක් සපුරා ගැනීම සඳහා පුද්ගලයන් පිරිසක් මෙහෙයවීමට ඇති හැකියාව නායකත්වය(Leadership) ලෙස සරලව අර්ථකථනය කළ හැකිය. මෙම නායකත්වය පිළිබඳ අධ්‍යයනය කිරීමේදී බුද්ධ චරිතයට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. ක්‍රි.පූ. 6 වන සියවසේ සංකීර්ණ සමාජ, ආගමික, දාර්ශනික වටපිටාවක් පැවති භාරතය තුළ පහළ වී ප්‍රතිශ්‍රෝතගාමී නව දර්ශනයක් ලොවට හඳුන්වා දෙමින් සිවුවනක් පිරිසකගෙන් යුත් විශාල අනුගාමිකයන් පිරිසකට මාර්ගෝපදේශකත්වය සපයන්නට යෙදුණු බුදුරදුන් නායකත්වය තුළින් අපේක්ෂා කරනු ලබන සියලුම සද්-ගුණයන්ගෙන් පරිපූර්ණ චරිතයකි. ඒ නිසාම ලොව බිහි වූ ශ්‍රේෂ්ඨතම හා ආදර්ශමත්ම නායකයාණන් ලෙස තථාගතයාණන් වහන්සේ හඳුන්වාදිය හැකිය. ඒ අනුව මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ බවට පත් වූයේ බුද්ධ චරිතයෙන් පිළිඹිබු වන සුවිශේෂ නායකත්ව ලක්ෂණ පිළිබඳ අවබෝධයක් ලබා දීමයි. ඒ සඳහා මූලික වශයෙන් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය අධ්‍යයනය කිරීම සිදු කෙරුණි. බුදුන් වහන්සේ ලොව ශ්‍රේෂ්ඨතම නායකයාණන් බව ලෝකනාථො, නායකො, පුබ්බඞ්ගමො ආදි සුවිශේෂී නාමයන්ගෙන් උන්වහන්සේව හැඳින්වීමෙන් ද තහවුරු වේ. ඒ අනුව බුද්ධ චරිතයෙන් පිළිඹිබු වන නායකත්ව ලක්ෂණ කවරේද? යන්න විමසීම මෙහි පර්යේෂණ ගැටලුව බවට පත් විය. බුදුන්වහන්සේ කිසිදු විටෙක තම නායකත්වය අවභාවිත නොකළ සේක. එසේම අනුගාමිකයන් සෑම විටම තම අණසකට යටත්ව සිටිය යුතු යැයි අදහසක් ද උන්වහන්සේ සතු නොවීය. අවශ්‍ය අවස්ථාවලදී බලය කේන්ද්‍රගත කරමින් ද විමධ්‍යගත කරමින් ද ශාසනයේ යහපැවැත්ම වෙනුවෙන් සෑම විටම කටයුතු කරන්නට විය. තම ඇවෑමෙන් පසු ශාසනය තුළ ඇති විය හැකි අර්බුදකාරී තත්ත්වයන්ගෙන් එය ආරක්ෂා කර ගැනීම සඳහා ධර්මය වටා අධිකාරීමය බලයක් කේන්ද්‍රගත කිරීම උන්වහන්සේගේ නායකත්වයේ සුවිශේෂ ලක්ෂණයකි. යථෝක්ත කරුණුවලට අමතරව තථාගතයාණන් වහන්සේ සතු චරිතවත් බව, අගතිගාමී නොවීම, යථාවාදී-තථාකාරී බව, සමානාත්මතාව, නම්‍යශීලීභාවය ආදී සුවිශේෂ නායකත්ව ලක්ෂණ රාශියක් පිළිබඳ මනා අවබෝධයක් ද පෙළදහමේ එන කරුණු අධ්‍යයනය කිරීම තුළින් අපට ලබාගත හැකිය. බුදුරජාණන් වහන්සේ සතුව පැවති මෙම අසහාය නායකත්වය නිසාම උන්වහන්සේ අන්‍යාගමිකයන් අතර ඇගයීමටත්, ගෞරවයටත් පාත්‍ර විය. ඒ බව පෙළ දහමේ එන සෝණදණ්ඩ, චංකී වැනි සූත්‍ර දේශනා තුළින් පසක් කරගත හැකිය. යථෝක්ත කරුණු අධ්‍යයනය කිරීම තුළින් එතෙක් මෙතෙක් ලොව පහළ වූ අසමසම නායකයාණෝ බුදුන්වහන්සේ බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද:** අනුගාමිකයන්, අසමසම, නායකත්වය, පෙළදහම, බුදුන් වහන්සේ

# පුද්ගල උභයාර්ථ සාධනය සඳහා බෞද්ධ ආර්ථික කළමනාකරණයෙහි උපයෝගීතාවය.

U. B. M. D. A. M. බාලසූරිය
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය
නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය,කැලණිය.
dulanjalianuruddhika2@gmail.com

බෞද්ධ ආර්ථික දර්ශනය තුළ ධනවත් වීම සෑම පුද්ගලයෙකු තුළම පවතින අපේක්ෂාවක් ලෙස බුදුරදුන් පෙන්වා දී ඇති අතර එමගින් පුද්ගල ජීවිතය සැපවත් කර ගත යුතු බව බුදු සමය පෙන්වා දෙයි. මේ සඳහා බුදුරදුන් ආර්ථික කළමනාකරණය පිළිබඳ සූත්‍ර දේශනා රැසක් ආශ්‍රයෙන් කරුණු ඉදිරිපත් කර ඇත. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ මෙලොව පරලොව උභයාර්ථයෙහි ම අභිවෘද්ධියට බෞද්ධ ආර්ථික කළමනාකරණය මහෝපකාරී වන බව සොයා බැලීමය. මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ එම බෞද්ධ ආර්ථික කළමනාකරණය පුද්ගලයාගේ උභයාර්ථ සාධනයට උපකාරී වන්නේ ද? ඒ කෙසේද? යන්නයි. ඒ අනුව මෙහිදී ප්‍රාථමික මෙන්ම ද්විතීයික මූලාශ්‍රයන් ද ඇසුරු කරගනු ලැබේ. මෙලොව ජීවිතයේ දියුණුවට මෙන්ම පරලොව ජීවිතයේ දියුණුවට හේතුවන ධර්ම කාරණා දේශිත ය, ඒ මොනවාද?, එමගින් ධනය කළමණාකරණය කර ගන්නා අයුරු සහ දෙලොව ජීවිතයේ දියුණුවට බලපාන්නේ කෙසේද?, ධාර්මික හා අධාර්මික ධනෝපායන මාර්ග සහ ඒවා උභයාර්ථ සාධනය සඳහා බලපාන්නෙ කෙසේද?යන්න විමසා බැලේ. බුදු දහමට අනුව පුද්ගලයා ධනය ඉපැයීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු? මොනවාද සහ මනා කළමනාකාරීත්වයකින් යුතුව ධනය පරිභෝජනය කළ යුත්තේ කෙසේද? යන පැතිකඩ අධ්‍යයනයෙන් මෙම පර්යේෂණය සිදුකර ඇත. අංගුත්තර නිකායේ පත්තකම්ම සූත්‍රය, අන්ධ සූත්‍රය, ව්‍යග්ගපජ්ජ සූත්‍රය, අනණ සූත්‍රය වැනි සූත්‍ර දේශනාවන් හී මේ පිළිබඳව ඉදිරිපත් කර ඇත. ඒ අනුව මෙලොව පරලොව දියුණුවට හේතුවන කරුණු මගින් ධනය ඉපැයීමේදීත් ඉපැයූ පසුවත් මනා කළමනාකාරීත්වයකින් යුතුව කටයුතු කිරීමෙන් මෙලොව ජීවිතය සදාචාරාත්මකව හා සැපවත්ව ගතකළ හැකි අතර ඒවා ධාර්මික විය යුතු බව පෙන්වා දේ. බුදුරදුන්, කළ යුතු හා නොකළ යුතු ධනෝපායන මාර්ගයන් මේ සඳහා පෙන්වා දී තිබේ. ඒ අනුව පුද්ගලයා ධාර්මික වීම, මධ්‍යස්ථ වීම, අනලස් වීම, සදාචාර සම්පන්න වීම යන කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් නිවැරදිව පරිභෝජනය කළ යුතු ය. මේ ආකාරයට කටයුතු කරන පුද්ගලයා මෙලොව ජීවිතයේ දී අත්ථි සුඛ, භෝග සුඛ, අනණ සුඛ, අනවජ්ජ සුඛ ලෙස සැප හතරක් අත්විඳියි. මෙසේ ක්‍රියා කරන්නාගේ පරලොව දිවිය ද සුගතිගාමී වෙයි. දිළිඳුකමින් පෙළෙන්නාට සැපවත් දිවියක් ගතකල නොහැකි අතර මානසික අසහනය පෙරටු වන හෙයින් ධර්මාවබෝධය ද අපහසු ය. නමුත් මෙලොව දිවිය සැපවත්ව ගත කරන්නා මානසික අසහනයකින් තොර වන අතර ඔහුට ධර්මාවබෝධය ලබා ගැනීම ඉතා පහසු ය. එහෙයින් ඔහුගේ පරලොව සාධනය දිළින්දාට වඩා වේගවත් ය. එබැවින් බෞද්ධ දර්ශනයට අනුව ආර්ථිකය කළමනාකරණය කර ගැනීම පුද්ගලයාගේ මෙලොව පරලොව දියුණුවට උපයෝගී වන බව නිගමනය කළ හැකිය.

# නාගාර්ජුනපාදයන්ගේ සුහෘල්ලේඛ කාව්‍ය ග්‍රන්ථය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**ඒ.කේ.සී. අයේෂානි අබේසිංහ**
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, බෞද්ධ අධ්‍යයන පීඨය,
නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, කැලණිය.
chamoayesha9653@gmail.com

මහායාන ධර්මය ව්‍යාප්ත කිරීමෙහිලා මූලිකත්වය ගෙන ක්‍රියා කළ නාගාර්ජුනපාදයෝ මාධ්‍යමක දර්ශනයේ ආරම්භකයා වේ. උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨතම රචනය මූලමධ්‍යමකකාරිකාව වන අතර චතුඃශතක, සූත්‍රසමුච්චය, බෝධිචිත්තවිවරණ යනාදිය ද උන්වහන්සේගේ නාමය යටතේ පවතින ධර්ම ග්‍රන්ථයන්ගෙන් කිහිපයකි. නාගාර්ජුනපාදයන්ගේ ග්‍රන්ථ සමුච්චය අතරින් 'සුහෘල්ලේඛ' නම් කාව්‍ය ග්‍රන්ථයේ අන්තර්ගතය පිළිබඳ විමසුමක යෙදීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. මහායාන ධර්මයේ දාර්ශනික සංකල්ප විග්‍රහයෙහිලා වැඩි නැඹුරුවක් දැක්වූවෙකු වශයෙන් නාගාර්ජුනපාදයෝ ප්‍රචලිතය. නමුත් සුහෘල්ලේඛ එයින් අන්‍ය වූවකි. තමාට හුරු පුරුදු දාර්ශනික රටාවෙන් තරමක් පරිබාහිරව රචිත සුහෘල්ලේඛ ග්‍රන්ථය මගින් නාගාර්ජුනපාදයෝ පොදු ජනමන ආමන්ත්‍රණය කරයි ද යන්න පිළිබඳ මෙමගින් විමසනු ලැබේ. ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍රය යොදා ගනිමින් සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය කිරීමේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ මෙම පර්යේෂණය සිදු කෙරේ. 'සුහද අස්න' හෙවත් 'යහළුවාට යවන ලිපිය' ලෙස සිංහලට පරිවර්තනය කළ හැකි සුහෘල්ලේඛ යන්න නාගාර්ජුනපාදයෝ සාතවාහන නම් තම මිත්‍ර රජුට යවන ලද කාව්‍යමය ලිපියකි. සුහෘල්ලේඛයේ අන්තර්ගතය විමසීමේ දී එය අංශ කිහිපයක් ඔස්සේ විහිදී පවතියි. ප්‍රායෝගික දිවිය හා සදාචාරාත්මක පැවැත්ම අර්ථාන්විත කරගැනීමට අවැසි ධර්මෝපදේශයන් ලෙස හිංසාව, සොරකම, සුරාපානය, මුසාවාදය ආදියෙන් තොර වීම පිළිබඳ වූ ප්‍රතිපත්ති මාලාවක් සඳහන් කරන නාගාර්ජුනපාදයෝ මවුපිය උපස්ථානය, ඉවසීම, වෛර නොකිරීම, සිල්වත් බව අගය කොට දක්වයි. එමෙන්ම බුදු දහමේ මූලික ධර්ම සංකල්ප ඉස්මතු කර දක්වාලන අතර පාපය හා පාප කර්ම විපාක, කාමය හා කාම ලෝලීත්වය, සංසාරය, ස්කන්ධ, මෝක්ෂය ආදී සංකල්ප ඒ අතර වේ. බුද්ධ භාෂිතයන් උපුටා ගනිමින් ඒවා ඇසුරෙන් පද්‍ය ගොඩනගාලන උන්වහන්සේ බුද්ධ දේශනාවන්හි සාරය නිදර්ශක සහිතව සරලාකාරයෙන් ඉදිරිපත් කරයි. නිවනේ ශ්‍රේෂ්ඨත්වය විද්‍යාමාන කරමින් බුද්ධත්වය වර්ණනාවට ලක්කරන අතර ක්‍රමයෙන් බුද්ධත්වයට පත්වන ලෙසත් අවසාන පද්‍ය ද්විත්වයෙදි සඳහන් කරයි. සුහෘල්ලේඛයේ සමස්ථ පද්‍ය ප්‍රමාණය 123ක් වන අතර 9, 15, 16 38, 39 වැනි පද්‍ය ප්‍රායෝගික ජීවිතයේ සදාචාරාත්මක සංවර්ධනය සඳහා අවැසි උපදෙස් මාලාවකින් සමන්විතය. මෙහි පද්‍ය පනහකටත් වැඩි ප්‍රමාණයක් වෙන්ව ඇත්තේ මූලික බෞද්ධ සංකල්ප පිළිබඳ පැහැදිලි කිරීමටයි. 105 - 109, 113 හා 114 ආදී පද්‍ය නිර්වාණයේ ශ්‍රේෂ්ඨත්වය හා බුද්ධත්වය වෙත සිත යොමු කිරීම විශද කරයි. මේ අනුව නාගාර්ජුනපාදයන්ගේ සුහෘල්ලේඛ කාව්‍ය ග්‍රන්ථය පුද්ගල සදාචාරයෙන් ආරම්භව බුද්ධත්වය දක්වා ක්‍රමිකව, නිශ්චිත පෙළගැස්මකට අනුව නිරවුල්ව හා ආයාසයකින් තොරව තේරුම් ගත හැකි වන පරිදි ලියූ කාව්‍ය ග්‍රන්ථයක් බව නිගමනය කළ හැකිය. එමගින් නාගාර්ජුනපාදයෝ සුහෘල්ලේඛ හරහා පොදු ජන මන සාර්ථකව ආමන්ත්‍රණය කරනා බැව් පෙන්වා දිය හැකිය.

**ප්‍රමුඛ පද :** නාගාර්ජුනපාදයෝ, පුද්ගල සදාචාරය, පොදු ජන මනස, බුද්ධත්වය, සුහෘල්ලේඛ

# වත්මන් භික්ෂුවගේ පැවැත්මට විනය නීතීන්ගේ උපයෝගීතාවය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

**ලබුනෝරුවේ ධම්මවිහාරී හිමි.**
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය,
නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය,මානෙල්වත්ත, කැලණිය.
bkldhammavihari@gmail.com

බුදුන් වහන්සේ විසින් තම ශ්‍රාවකයන් උදෙසා පනවා ඇති නීති සමුදාය හෙවත් විනයල ශාසනයේ ආයුෂ වශයෙන් හඳුන්වා ඇත. වත්මන් ඇතැම් සමාජ සංස්ථාවන්හි බෞද්ධ භික්ෂූන් පිළිබඳ ඇති විරුද්ධ වාදී ආකල්පයන්හි වැඩි වීමක් හා ඉතා සූක්ෂ්ම ලෙස භික්ෂූන් වහන්සේ විනය විරෝධී ක්‍රියාවන්ට පොළඹවා ඒවා සමාජ මාධ්‍යය හරහා ප්‍රචලිත කර තරුණ ප්‍රජාව තුළ බෞද්ධ භික්ෂූන් අතිශය ගැරහීමට පාත්‍ර කොට, බෞද්ධ විරෝධී ආකල්ප ඇති කිරීමේ උත්සාහයක් මෙකල මෙරට ඉතා ප්‍රකට ව පැවතීමට පසුබිම් වන සාදක කවරේ ද යන්න මෙම පර්යේෂණයේ ගැටළුව වන අතරල එසේ වීමට හේතුව වශයෙන් වත්මන් භික්ෂූන් වහන්සේ තුළ බුද්ධ නීති සමූහය හෙවත් භික්ෂු විනය පිළිබඳ නිසි අවබෝධයක් නොමැතිකම හා විනය නීතිය කෙරෙහි අනුගත නොවීම යන කරුණ යථෝක්ත ගැටලුව කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ ව විමර්ශණාත්මක අධ්‍යයනයක් සිදුකිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. මෙහිදී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර අනුසාරයෙන් විනය නීති හා බුදුන් වහන්සේ එම නීති පැනවූයේ කවර අර්ථයක් උදෙසා ද යන්න පිළිබඳ ව හා එය පෞද්ගලික භික්ෂු ජීවිතයට මෙන්ම සමස්ත සඞ්ඝ සංස්ථාවට හා බුදු සසුනේ චිරස්ථිතියට හෝ පරිහානියට බලපාන ආකාරය ඓතිහාසික තොරතුරු ද භාවිතයට ගෙන මූලික වශයෙන් අධ්‍යයනය කර ඇති අතර, වත්මන් භික්ෂූන් වහන්සේ තුළ විනය නීති පද්ධතිය පිළිබඳ ඇති අවබෝධය අඩු වීමට හේතු විමසීම ද සිදු කරන ලදි. එහිදී, විශේෂයෙන් වර්තමානයේ භික්ෂූන් වහන්සේ වෙනුවෙන් සැකසී ඇති අධ්‍යාපන ක්‍රමවේදය මේ කාරණයෙහි ලා කෙතෙක් දුරට බලපෑමක් සිදු කර ඇතිද යන්න පිළිබඳ ව මූලාශ්‍රය හා මානව සම්පත් අනුසාරයෙන් විමසීමට ලක් කරන ලදි. එහිදී මෙරට වර්තමානයේ භික්ෂූන් වහන්සේ වෙනුවෙන් සකසා ඇති පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය තුළ හා ඉන් මතු උසස් අධ්‍යාපන ක්‍රමය තුළ භික්ෂු විනය පිළිබඳ ව ගැඹුරින් අධ්‍යයනය කිරීමේ විෂය පථයක් නොමැති වීම හා ශ්‍රද්ධාව හීන වීම හේතුවෙන් පරමාර්ථය පසෙකලා භික්ෂූන්ද ද රැකියා අවස්ථා වෙනුවෙන් සැකසුණු අධ්‍යාපන රටාවක් ඔස්සේ ගමන් කිරීම නිසා භික්ෂුවක් වීමේ පරමාර්ථය කෙරෙන් ක්‍රමයෙන් දුරස් වීම යථෝක්ත සමාජ පරිහානිය කෙරෙහි බලපා ඇති බව අනාවරණය කරගත හැකි විය. මෙම පරිහානියෙන් ශාසනය හා භික්ෂූන් වහන්සේ මුදවා ගැනීමට නම් ශාසන පරමාර්ථය පදනම් කරගත් විනය මූලික අධ්‍යාපන ක්‍රමවේදයක් සියලු භික්ෂූන් වහන්සේ වෙනුවෙන් සැකසිය යුතු ව පවතන බවට ද නිගමනය විය.

ප්‍රමුඛ පදඃ- බුද්ධ නීති, ශාසන විරෝධය, අධ්‍යාපනය, චිරස්ථිතිය, පරිහානිය

# පොදු වැසිකිළි භාවිතයේ දී ඇති වන ගැටළු අවම කරගැනීම සඳහා විසඳුම්
## (විනය පිටකයේ චුල්ලවග්ගපාළියේ වැසිකිළි වත ඇසුරින්)

**පූජ්‍ය රිල්හේනේ සුධීර හිමි**

තෙවන වසර බෞද්ධ අධ්‍යන පීඨය,
නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යන ආයතනය
මානෙල්වත්ත,කැළණිය
rilhenesudheera@gmail.com0714046447 / 0752208955

මිනිසාගේ පොදු අවශ්‍යතා අතර වැසිකිළි භාවිතය ප්‍රමුඛ වේ. ඕනෑම රටක පාහේ වැසිකිළි භාවිතයේ දී ඊට අනුකූල වූ පොදු සමාජ ආචාරධර්ම පද්ධතියක් පවතින අතර ගෘහස්ථ වැසිකිළි භාවිතයටත් වඩා පොදු වැසිකිළි භාවිතයේ ආචාරධර්ම වඩාත් තීව්‍ර විය යුතු ය. සෑම රටක ම නගර හා පොදු ස්ථාන මුල් කර ගනිමින් පොදු වැසිකලි පද්ධතියක් ස්ථාපිත වී තිබුණ ද ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රධාන නගර ආශ්‍රිත පොදු ස්ථානයන්හි වැසිකිළි භාවිතය තුළ දක්නට ඇත්තේ ඉතා අසතුටුදායක ස්වභාවයකි. ඊට හේතු පාදක වී ඇත්තේ පුද්ගලයා විසින් වැසිකිළි භාවිතයේ දී අනුගමනය කළ යුතු ඇති ආචාරධර්ම නිසි ලෙස ඉටු නො කිරීම ය. මෑත ඉතිහාසයේ ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ද සෞඛ්‍යාරක්ෂිත ජීවන රටාවක් සඳහා අනුගමනය කළ යුතු ආචාරධර්ම පද්ධතීන් ප්‍රඥප්ති ලෙස පෙන්වා දී තිබුණ ද ක්‍රි:පූ හයවන සියවසේ පහළ වූ බුදුරජාණන් වහන්සේ විසින් වැසිකිළි භාවිතයේදී පැවතිය යුතු ආචාරධර්ම ඊට පළමු ව පෙන්වා දී තිබීම ඉතා අගය කොට සැලකිය යුතු ය. වැසිකිළි භාවිතයේ පැවැතිය යුතු පොදු ආචාර ධර්ම පද්ධතිය විනය පිටකයේ චුල්ලවග්ගපාළියේ වැසිකිළි වතෙහි සඳහන් වන අතර මෙය භික්ෂූන් වහන්සේලාගේ වත් සම්බන්ධයෙන් දේශනා කළ ද වැසිකිළි භාවිතය සියල්ලන්ගේම පොදු අවශ්‍යතාවක් බැවින් එය සියල්ලන්ටම පොදු බව සැලකිය යුතු ය. මෙහිදී බුලත්විට ආදිය හපමින් මළපහ නො කිරීම, වැසිකිළි ඔරුවෙන් පිටත මළපහ නොකිරීම, මුත්‍ර ඔරුවෙහි කෙළ නොගැසීම, අපද්‍රව්‍ය වැසිකිළිය තුළ නොදැමීම, වැසිකිළිය කසළවලින් යුක්ත වේ නම් එය හැමදීම, වැසිකිළියේ පිල්කඩ හා වැසිකිළිය වටා බිම හැමදීම, ජල රඳවනයෙහි ජලය හිස් නො කොට පුරවා තැබීමට කටයුතු කිරීම ආදිය පොදු වැසිකිළි පද්ධතියක් පවිත්‍ර ව තබා ගැනීමට අවශ්‍ය සාධක ලෙස වැසිකිළිවත තුළ පෙන්වා දී තිබේ. මෙම කරුණු දෙස අවධානය යොමු කිරීමේදී පැහැදිලි වන්නේ මෙම ආචාරධර්ම නිසි ලෙස අනුගමනය කරන්නේ නම් පොදු වැසිකිළි භාවිතයේදී ඇති වන ගැටළු මගහරවා ගත හැකි බව ය. පුද්ගල වගකීමක් ලෙස ගත් කල මෙය සාමූහික ක්‍රියාවක් විය යුතු වුව ද වත්මනයේ සිදුවෙමින් පවතින්නේ තම අවශ්‍යතාවය පමණක් ඉටු කර ගනිමින් පුද්ගලයා තම වගකීමෙන් බැහැරව යාමය. එම නිසාවෙන් මෙය ලාංකීය අධ්‍යාපන ක්‍රමවේදය තුළ ප්‍රායෝගික විෂය පද්ධතියක් බවට පත් කිරීම මේ සඳහා පිළියම බවට නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද :** පොදු, ආචාරධර්ම ,භාවිතය, අනුගමනය, වැසිකිළිය

# මිහින්තලා පුවරු ලිපියේ ආර්ථික දර්ශනය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (දෙවන පුවරු ලිපිය ඇසුරෙන්)

**එස්. ඒ. එස්. චතුරිකා, කේ. රුවින්ද ධනංජය**
නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලය,
බෞද්ධ අධ්‍යයන පීඨය, තෙවන වසර,
sujanichathurika226@gmail.com / runindakarunakalage1998@gmail.com

දහවන සියවසේ IV වන මිහිඳු රාජ්‍ය සමයේ පිහිටුවන ලදැයි සැලකෙන මිහින්තලා පුවරු ලිපිය අනුරාධපුරයට සැතපුම් 8ක් නැගෙනහිරින් මිහින්තලා පර්වතයේ පිහිටා ඇත. පේළි 58 කින් යුත් මෙම ලිපියේ ආරාමික සේවකාදීන්ට ගෙවිය යුතු වැටුප් ප්‍රමාණ හා අයවිය යුතු බදු ආදිය පිළිබඳව සඳහන් වේ. මූලික වශයෙන් භික්ෂූන් වහන්සේලාගේ සේවාවන් වෙනුවෙන් ලබාදුන් වේතන, ආරාමික ධනය ආරක්ෂා කිරීම, ගිණුම් පොත් පවත්වාගෙන යාම සහ බදු ක්‍රමය පමණක් නොව වේතන ගෙවන ලබන පිරිසගේ කායික මානසික යහපැවැත්ම මෙන්ම සංවර්ධනය උදෙසා ද ක්‍රියාත්මක වූ සංවිධිත ආර්ථික ක්‍රමයක් හඳුනාගත හැකිය. මේ අනුව මෙම ලිපියෙන් හෙළිවන ආර්ථික දර්ශනය වත්මන් ආර්ථික සන්දර්භය තුළ යාවත්කාලීන කිරීම ප්‍රායෝගික යථාර්ථයක් ද යන්න පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි අධ්‍යයන ගැටලුවයි. ප්‍රධාන වශයෙන් වර්තමානය තුළත් එවන් සංවිධිත ආර්ථික රටාවක් ගොඩනැංවීම තවදුරටත් මෙහි අරමුණයි. එකල ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමයක් පැවති බව රත්‍රං කලං 15 (පවුම් 2) ක් වේතන ලෙස ගෙවීමෙන් පැහැදිලි වන අතර නව කර්මාන්ත ඉදි කිරීම හෙවත් ආයෝජන ක්‍රමයක් කණ්ඨක සෑය හා ගිරිභණ්ඩ පර්වත ගෘහය ආශ්‍රිතව පැවතීමෙන් හඳුනාගත හැකිය. චේතියගිරිය හා අභයගිරි විහාරයන්හි වර්ෂාවසාන අයවැය ලේඛන භික්ෂූන් ඉදිරිපිට කියවා නිම කිරීම අත්‍යවශ්‍ය විය. චාරිත්‍ර ඉක්මවන්නන්ට දඬ ලබා දීම, අදාල නිවාඩු පමණක් ලබාදීම, නිසි වැටුප් ලබාදීම, කායික මානසික තෘප්තිය වර්ධනය කිරීම සහ විධිමත් ව්‍යවස්ථා මාලාවක් ඔස්සේ සමස්ථ ආර්ථිකය කළමනාකරණය කොට ඇත. මෙය නූතන ආර්ථික ඵලදායිතාවය උදෙසා ද අතිශය කාලෝචිතය. සම්පත් බෙදීයාම, ආදායම් වියදම් සමබරතාව, අත්තනෝමතික ක්‍රියාවන් පිටු දැකීම සහ සමාජ, ආර්ථික සම්බන්ධය තහවුරු කොට පවතින ආර්ථික අර්බුදයන් සමනය කළ හැකිය. මේ සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ ද්විතීක හා පුරාවිද්‍යා මූලාශ්‍රය භාවිතාවට ගැනීමත් ප්‍රාමාණික විද්වත් සාකච්ඡා සහ පුස්තකාල වාර්තා ආදියත් භාවිතා කෙරේ. එකල ආර්ථිකයේ ආඪ්‍ය බව මෙම ලිපියෙන් පැහැදිලි වන අතර ගිණුම්කරණ විෂයේ මූලබීජ මෙම පුවරු ලිපිය හරහා අනාවරණය වන බව උපකල්පනය කළ හැකිය. උක්ත සාධකය ඔස්සේ බලන කල දෙවන පුවරු ලිපිය නූතන ආර්ථිකයට අර්ථවත් ටීකාවක් බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද :- සංවිධිත ආර්ථිකය, ස්වයංපෝෂිත, අයවැය, කළමනාකරණය, ඵලදායිතාව

# රාජාංගනය අප්‍රකට බෞද්ධ සංස්කෘතික නටබුන් පිළිබඳ අධ්‍යයනයක් (රාජාංගනය වැව දකුණු ඉවුර ඇසුරෙන්)

**ඩී.එම්. සෙනරත් බණ්ඩාර දිසානායක**
arch89senarathbandara@gmail.com
071-9719425

රාජාංගනය වැවෙහි දකුණු ඉවුර ලෙසින් ප්‍රකට වන බිම්කඩ අයත් වන්නේ අනුරාධපුර දිස්ත්‍රික්කයට වේ. රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් මෙම ප්‍රදේශය පාලනයට ලක්වේ. ප්‍රදේශය පුරා පුරාවිද්‍යාත්මක ලෙස සිදු කළ අධ්‍යයන සඳහා අවම මැදිහත්වීමක් සිදුව ඇත. පැරණි විහාර, චෛත්‍යය, ගල්කණු, විවිධ ග්‍රාම විහාර ආදිය එම ප්‍රදේශය පුරා පිහිටා ඇත. මෙම බෞද්ධ පුරාවස්තු පිළිබඳව විධිමත්ව අධ්‍යයනය කිරීම මෙහි මූලික අරමුණ වේ. රාජාංගනය හා එහි පෞරාණික තත්ත්වය කවරේද? රාජාංගනය පුරා ව්‍යාප්තව ඇති අනාවරණය නොවූ සංස්කෘතික උරුමයක්ද? එකී සංස්කෘතික උරුමය තුළ දක්නට ලැබෙන භූ භෞතික හා සංස්කෘතික භූ දර්ශනය කවරේද? ගල්පර්වත මත විහාර හා ස්තූප තැනීමේ අරමුණ කුමක්ද? යන පර්යේෂණ ගැටලුවට පිළිතුරු සෙවීම සඳහා පුරාවිද්‍යාත්මක දත්ත හා මහාවංශය, දීපවංශය, චූලවංශය, සමන්තපාසාදිකාව ආදී වංශකථා වලින් හෙළිවන ප්‍රාථමික දත්ත උපයෝගි කර ගනිමින් නූතන පර්යේෂකයන් වන පරණවිතාන සහ එච්. සි. පි. බෙල් මහතාගේ පර්යේෂණයන් තුළින් ද, එල්ලාවල මේධානන්ද හිමි හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් රචිත අනුරාධපුර දිස්ත්‍රික්කයේ ස්මාරක ස්ථාන නම් ද්විතියික මූලාශ්‍ර වලින් හෙළි කරන දත්ත සමඟ සැසඳීම තුළින් නිගමනවලට එළඹීම මෙහි ක්‍රමවේදය වේ. මෙහිදී පර්යේෂක හට ප්‍රදේශයේ ඇති වෙහෙර විහාර, ගල් පාලම්, ගොඩනැගිලි ආදී බෞද්ධ නටබුන් බොහෝමයක් හමු වී ඇත. මේ අතර අංගමුව වැව හෙවත් ඉතිහාසයේ සඳහන් වන ''අහල වැව'' ''අහල'' නම් ඇමතියකු විසින් කරවන ලද බව සඳහන් වේ. එහෙත් ආඬියාගල ගල් ලෙන් හා පර්වත මස්තකයෙහි හමුවන නටබුන් හා ස්ථූප ගොඩැලි කිහිපයක්, පහළමාලයේ ලෙනක දක්නට ලැබෙන අඩක් නෙළා අතහැර දැමූ ප්‍රතිමාවක ලක්ෂණත් විද්‍යාමාන වේ. එය ආඬිරුව ලෙස නම් කර ඇති අතර මෙම ප්‍රදේශයේ හමුවන යාය 8 අංගමුව පිරිවනෙහි මෑත කාලයේ කැනීම් කර මතු කරගත් ස්ථූපය ක්‍රි.පූ. 1 වන සියවසට පමණ ගමන් කරන බව පුරාවිද්‍යාඥයන්ගේ මතය වේ. මේවා ශාස්ත්‍රීය වශයෙන් ගලපමින් විධිමත්ව අධ්‍යයනයට භාජනය කිරීම සිදු වේ.

**ප්‍රමුඛ පද** :- පුරාණ රාජාංගනය, සංස්කෘතිය, බෞද්ධ නටබුන් වෙහෙර විහාර

# බෞද්ධ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්(සිඟාලෝවාද සූත්‍රය ඇසුරින්

akmeemanakassapa1@gmail.com

මානව සම්පත් කළමණාකරණය යනු සංවිධානයක ඉලක්ක හා පරමාර්ථ ළඟා කර ගැනීම සඳහා වඩා යෝග්‍ය හා තෘප්තිමත් මානව සම්පතක් ජනිත වන අයුරින් ආයතනයේ මානව සම්පත සඵලදායීව හා කාර්යක්ෂමව ලබා ගැනීම හා රඳවා ගැනීම සම්බන්ධ ක්‍රියාකාරකම් සමුදායයි. මානව සම්පත කළමනාකරණය කිරීමේදී කුලය, ජාතිය. වර්ගය, වර්ණය සමාජ ස්වභාවයන් හේතු කොට ගෙන උසස් ලෙස හෝ පහත් ලෙස නොසැලකීම බෞද්ධ දර්ශනය තුළ විශිෂ්ට ලක්ෂණයක් ලෙස දැක්විය හැකිය.මානව සම්පත නිවැරදිව යොදා ගැනීමට සිතන ඕනෑම පුද්ගලයෙකු විසින් එම දාර්ශනික පදනම නිවැරදිව හඳුනා ගත යුතුය. වර්තමාන සමාජය තුළ මෙම මානව සම්පත සංකීර්ණ ස්වභාවයක් පෙන්නුම් කරයි. බුදු දහමට අනුව සමස්ත සමාජයේ මානව සම්පත ගිහි හා පැවිදි වශයෙන් ප්‍රධාන කොටස් දෙකක් යටතේ වර්ග කර දක්වා ඇත. ගිහි සමාජය නැවත උපාසක උපාසිකා ලෙස ද පැවිදි සමාජය භික්ෂු-භික්ෂුණී ලෙස වර්ග කර  දක්වා ඇත. බුදු දහමට අනුව ඉහත මානව සම්පත යොදා ගනිමින් යහපත හා දියුණුව අරමුණු කරගනිමින් උපයෝජනය කර ඇත. මානව සම්පත් කළමනාකරණය සඳහා මනා ප්‍රවේශයක් සිඟාලෝවාද සූත්‍රය තුළ අන්තර්ගත වේ. මෙම සූත්‍රය තුළින් මානව සම්පත් කළමනාකරුවෙකු සතු  ගුණාංග හා විනය පාලනය පිළිබඳව මනාව පිළිබිඹු කරයි. මානව සම්පත් කළමනාකරණ කාර්යයන් සිදු කිරීමේ දී  සමාජ පසුබිම අනුව කළයුතු යුතුකම් කිහිපයක් සිඟාලෝවාද සූත්‍රය මගින් දක්වා තිබේ. සිඟාලෝවාද සූත්‍රය මඟින් ගොඩ නැගෙන ශ්‍රමික කළමනාකරණ පිළිවෙළ ලෙස සේවායෝජකයාගේ  යුතුකම්, මානව සම්පත් කළමනාකරණ කාර්යයන්, සේවක චර්යාව, සේවක යුතුකම් ආදිය පෙන්වා දිය හැකිය. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ මානව සම්පත කළමනාකරණය කිරීමේදී  ආර්ථික කළමනාකරණය කරනු ලබන මානව සම්පත කිනම් ආකාරයෙන් බුදු දහමට අනුව කළමනාකරණය කර ඇත්තේ කෙසේද යන්න අධ්‍යයනය කිරීමයි. මානව සම්පත් කළමනාකරණය පිළිබඳව බෞද්ධ ආකල්පය කෙබඳු දැයි ගැටලුව ලෙසත්, සිඟාලෝවාද සූත්‍රය ආදී මූලාශ්‍ර යොදා ගනිමින් ගුණාත්මක ක්‍රමවේදය ඔස්සේ සාහිත්‍යය මූලාශ්‍රය මගින් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම අතර පවතින සම්බන්ධතාවයත් බටහිර මානව කළමනාකරණයට වෙනස් අන්දමින් බෞද්ධ පැතිකඩ නිගමනය කර පෙන්වා දීම මෙම අධ්‍යයනයේ දී සිදුවේ.

**ප්‍රමුඛ පද :** කළමනාකරණය, බෞද්ධ කළමනාකරණය,මානව සම්පත, සිඟාලෝවාද, සමාජය

# අනුරාධපුර ශ්‍රී මහා බෝධි වැලි මළුවේ පිහිටි ප්‍රාර්ථනා බෝධිය හා බැඳුනු ජන විශ්වාසයන් පිළිබඳ අධ්‍යයනයක්

**යූ.ඩබ්.ප්‍රනාන්දු**
බෞද්ධ අධ්‍යනය පීඨය, නාගානන්ද විශ්වවිද්‍යාලය
wajifernando99@gmail.com

අනුරාධපුර පූජා නගරයේ ජය ශ්‍රී මහා බෝධි වැලි මළුවේ බටහිර දොරටුව සමීපයෙන් වන්දනාකරුවන්ගේ ගෞරවයට පාත්‍ර වූ ප්‍රාර්ථනා බෝධිය ලෙසින් ප්‍රචලිත සාම්බ්‍රානි වෘක්ෂයක් පවතින අතර ඒ හා බැඳුනු ජන විශ්වාසයන් මෙනාවාද යන්න අපගේ පර්යේෂණයේ ගැටළුව විය. මෙම පර්යේෂණයේ ප්‍රධාන පර්යේෂණ ක්‍රමවේදය ලෙස විහාරයේ ස්වාමීන් වහන්සේ, කපු මහතුන්, වන්දනාකරුවන් සහ ගම්වැසියන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සහ ස්ථානීය නිරීක්ෂණය යොදා ගන්නා ලදී. මෙම ප්‍රාර්ථනා බෝධිය සමීපයේ මීත් පෙර තිබී ඇත්තේ ප්‍රාර්ථනා ගල නමින් හැඳින්වූ නාග කැටයමක් සහිත ශිලාමය පුවරුවක් වන අතර එය මෑත කාලයේ දී එම ස්ථානයෙන් ඉවත් කොට ඇත. එම ශිලාමය පුවරුව එම ස්ථානයෙන් ඉවත් කළ පසුව ඉහත වන්දනාමාන ක්‍රම මෙම වෘක්ෂයට ආදේශ වූ අතර එය වඩාත් ජනප්‍රියභාවයට පැමිණි බව ද හඳුනා ගත හැකි විය. මෙම වෘක්ෂය සම්බන්ධ වන්දනාමාන කිරීමේ දී ජය ශ්‍රී මහා බෝධින් වහන්සේට හෝ ඒ ආශ්‍රිතව ඇති කළු දේවාතා බණ්ඩාර සංකල්පයට වඩා වෙනස් ස්වරූපයක් උසුලයි. මෙම වෘක්ෂය වන්දනාමාන කරන පිරිස මෙය කිනම් වෘක්ෂයක් ද යන්න පවා නොදන්නා අතර එහි කඳින් වහනය වන සුවඳ හේතුවෙන් මෙය සඳුන් වෘක්ෂයක් ලෙස ද හඳුන්වනු ලැබේ. මේ ආශ්‍රිතව මල්, පහන් ආදිය පිදීමක් දක්නට නොමැති අතර වෘක්ෂයේ කඳට හිස තබා වන්දනාමාන කිරීමත් පඬුරු දැමීම හෝ පඬුරු බැඳීම සිදු කරනු ලබයි. අපගේ පර්යේෂණයට අනුව අනාවරණය කර ගත හැකි වූයේ ස්ත්‍රී පුරුෂ හෝ වයස් සීමාවකින් තොරව මෙම වෘක්ෂය වන්දනාමාන කිරීම සිදු වන බවත් එසේ වන්දනා කිරීමට හේතුව කටවහරින් මේ පිළිබඳ දැනුවත් වීම හෝ අනෙක් වන්දනාකරුවන් අනුගමනය හා අනුකරණය කිරීම බවත් හෙළි විය. විභාග සමත් වීම, විවාහ සාර්ථක වීම, ලෙඩරෝදුක් මඟ හරවා ගැනීම, දරුඵල අපේක්ෂාවන් ආදී ප්‍රාර්ථනා මෙහිදී සුලබ ව සිදු කරනු ලැබේ. මේ අනුව මෙම පර්යේෂණයේ ප්‍රතිඵලය හා නිගමනය වන්නේ මෙම ප්‍රාර්ථනා බෝධිය හා බැඳුනු ජන විශ්වාසයන් ඉතා මෑත අවධියක දී සංවර්ධනය හා ප්‍රචලිත වූ බවත්, හුදු ලෞකික අපේක්ෂාවන් මූලික කරගෙන මෙම වන්දනාව සිදු කෙරෙන බවත් ය.

**මුඛ්‍ය පද** - ජන විශ්වාසය, ජය ශ්‍රී මහා බෝධිය, ලෞකික අපේක්ෂාවන්, සාම්බ්‍රානි වෘක්ෂ

# මිහින්තලා පුවරු ලිපිය තුළින් දර්ශනය වන ආරාම පාලනය පිළිබඳ කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්

**කේ. සිතාරි කෝෂිලා**
කැලණිය විශ්වවිද්‍යාලය (පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය)

**ඩී.එල්. මල්ෂා**
කැලණිය විශ්වවිද්‍යාලය (සිංහල අධ්‍යයනාංශය)
sitharikoshila99@gmail.com

බුදුරජාණන් වහන්සේ විසින් මුල් කාලීන භික්ෂූන් උදෙසා ඕවාද ප්‍රාතිමොක්ෂය ලබා දෙන ලදී. භික්ෂු ශාසනය වර්ධනය වීම හා ගිහි ජනයාගෙන් ලැබෙන පුද සත්කාර වැඩිවෙත්ම භික්ෂූන් වහන්සේලා උදෙසා විනය නීති පැනවීමට බුදුන් වහන්සේ ට සිදුවිය. ශ්‍රී ලංකාවේ ද නොයෙක් කාලයන්හි භික්ෂු ශාසනයේ නොයෙක් ගැටලුකාරී අවස්ථාවන් විසඳා ගැනීම උදෙසා විනය නීති සහිත ව්‍යවස්ථාවන් ස්ථාපිත කරන්නට විය. එහිදී ආරාම පාලනය උදෙසා නීති පැනවීම ද සිදුවිය. මිහින්තලා පුවරු ලිපිය එහි ප්‍රතිඵලයකි. මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ මිහින්තලා පුවරු ලිපිය තුළින් ආරාම පාලනය පිළිබඳ තොරතුරු අන්තර්ගත වන්නේද? යන්න පිළිබඳව විමර්ශනය කිරීමයි. මිහින්තලා පුවරු ලිපිය තුළින් දර්ශනය වන ආරාම පාලනය පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙහි අරමුණයි. මෙම අධ්‍යයනය සඳහා ප්‍රධාන ප්‍රාථමික මූලාශ්‍රය ලෙස පුරාවිද්‍යාත්මක මූලාශ්‍රවලට අයත් මිහින්තලා පුවරු ලිපිය පාදක කර ගන්නා ලදි. දහවන සියවසේ හතරවන මිහිඳු රජුගේ සමයේ ව්‍යවස්ථාපිත මිහින්තලා පුවරු ලිපිය  කොටස් දෙකකින් සමන්විත වන අතර එක් කොටසක පේළි පනස් අට බැගින් පේළි 116කින් යුක්ත වේ. ලිපියේ පළමු කොටසේ අන්තර්ගත වන්නේ චෛතියගිරි විහාරයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව යි. දෙවන කොටසේ අන්තර්ගත වන්නේ ආරාමික සේවකාදීන් ට ගෙවිය යුතු වැටුප් ප්‍රමාණයන් මෙන්ම විහාරයට අයත් විය යුතු බදු ආදිය පිළිබඳව යි. මිහින්තලා පුවරු ලිපිය තුළ සඳහන් ආරාම පාලනය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ප්‍රධාන වශයෙන් ආරාමයේ භික්ෂූණ් වහන්සේලා ට මෙන්ම විහාරාරාමවල සේවයේ නියුතු වූවන් සඳහා ද, ආරාමයට අයත් ඉඩකඩම් හා ආදායම්වලට පැනවූ නීති රීති ආදී වශයෙන් නීති රීති රැසක් මෙහි අන්තර්ගත වේ. මේ ආකාරයට ආරාමයන්හි සම්පත් නිසි ආකාරයෙන් කළමනාකරණය කළ ආකාරය මිහින්තලා පුවරු ලිපිය තුළින් හඳුනා ගත හැකි වේ. මෙම අධ්‍යයනය උදෙසා ප්‍රාථමික මූලාශ්‍රය ලෙස මහාවංශයත් ද්විතීක මූලාශ්‍රය ලෙස කොත්මලේ අමරවංශ හිමිගේ ලක්දිව ශිලා ලිපි යන ග්‍රන්ථය ඇතුළු තවත් ග්‍රන්ථ රැසක් මූලාශ්‍රය කොටගෙන තිබේ. මෙම අධ්‍යයනය බෞද්ධ කළමනාකරණය විෂය ක්ෂේත්‍රයේ සංවර්ධනයට වැදගත් වන අතරම වර්තමාන භික්ෂු ශාසනයේ අභිවෘද්ධිය උදෙසා ද මෙම අධ්‍යයනයෙන් ලබාගත් තොරතුරු උපයෝගී කරගත හැකිය.

**ප්‍රමුඛ පද** - අභිවෘර්ධිය, ආරාම පාලනය, ඕවාද ප්‍රාතිමෝක්ෂය, මිහින්තලා පුවරු ලිපිය, විනය නීති

# භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ උපයෝගීත්මක අධ්‍යයනයක්

diuyanjalit@gmail.com

භෞතික සම්පත් කළමනාකරණය යනු සීමිත සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමයි. භෞතික සම්පත් කළමණාකරනය තුළින් සම්පත් නිවැරදිව පරිහරණය කර ගන්නා ආකාරය පැහැදිලි කෙරේ. මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයන් අධ්‍යයනය කරන ලදි. බුදුදහම තුළ අන්තර්ගත වන ඉගැන්වීම් මගින් වර්තමාන සමාජයේ ජීවත් වන ජනතාවට උපයුක්ත කර ගන්නේ කෙසේ ද යන්න පෙන්වා දීම මෙම පර්යේෂණයේ අරමුණයි. බෞද්ධ ඉගැන්වීම් අනුව, ආයතනවල ව්‍යුහය මැනවින් සංවිධානය කළ යුතුය. ආයතනයක් තුළ සම්පත් නිවැරදිව පුද්ගල වුවමනා හා අවශ්‍යතාවයට පමණක් ගෙන කටයුතු කළ යුතු වේ. බෞද්ධ කළමනාකරණය සංකල්පයේ භෞතික සම්පත් කළමනාකරණය සාකච්ඡා කෙරේ. භෞතික සම්පත් කළමනාකරණය මහාවග්ග පාළියේ වත්තක්ඛන්ධකය තුළින් සාකච්ඡාවට ලක් කෙරේ. එහි භික්ෂූන් භෞතික සම්පත් කළමණාකරණය කර ඇති ආකාරය සඳහන් විස්තර වේ. බුදුන් භික්ෂූන්ට තුන් සිවුර පමණක් පරිහරණය කරන ලෙස උපදෙස් ලබා දී ඇත. ඉන් අත්‍යවශ්‍යම භාණ්ඩ පමණක් පරිහරණය කළ යුතු බව ගම්‍ය වේ. භික්ෂූන් දෙපට සිවුර, අඳනය, පාත්‍රය, දූලි පිහිය, ඉදි කටුව, පටිය, පෙරහන්කඩය, වශයෙන් භාණ්ඩ අටක් පාංශුකූලික වස්ත්‍ර චීවරය සකස්කර ගෙන තිබීම තුළින් සිවුර මනාව කළමනාකරණය කරගෙන ඇති බව. වත්තක්ඛන්ධකයේ ගමික වත තුළින් අනාවරණය වේ. ගමික භික්ෂුව විසින් දූවයෙන් තැනූ උපකරණ ආදිය සුරැකිව තැබිය යුතුය. දොරවල්, වා කවුළු වසා සෙනසුන රැක ගන්නට කෙනෙකුට දන්වා නික්මිය යුතුය. භික්ෂු නමක් නොවේ නම් හෙරණකට ද, හෙරණක් නොවේ නම් ආරාමිකයෙකුට ද, ආරාමිකයෙකු නොවේ නම් උපාසකයෙකුට හෝ දන්වා ආරාමයෙන් නික්මිය යුතුය. මේ අනුව භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ සඳහන් කෙරේ. ආරාමික භෞතික සම්පත් වන්නේ ආරාමය හා ආරාම භූමිය, විහාරය හා විහාර භූමිය, ඇඳ, පුටුව, කොට්ටය, සැළිය, කළය, කටාරම, වැය, පොරොව, කෙටේරිය, කියත, ලී බඩු, මැටි බඩු, අන් අයට පැවරීම කරගනිමින් ආරක්ෂා කරගත යුතු බවයි. බුදුදහමේ සඳහන් සංකල්ප මඟින් භෞතික සම්පත් කළමනාකරණය පවත්වා ගැනීම තුළින් වර්තමානයේ ජීවත් වන ජනතාවට සම්පත් නාස්තිය අවම කර ගනිමින් භෞතික සම්පත් ආරක්ෂා කරගත හැකි බව නිගමනය කළ හැකි වේ.

ප්‍රමුඛ පද : වත්තක්ඛන්ධකය, භෞතික සම්පත්, කළමනාකරණය, බුදුදහම, භික්ෂූන් වහන්සේ

# පබ්බතාරාම නිර්මාණය සඳහා පදනම වූයේ බෞද්ධ ඉගැන්වීම් ද?.

**පූජ්‍ය දෝතළුඔය නාරද හිමි.**
සමාජීයවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුර
dothaluoyanarada2000@gmail.com

අනුරාධපුර යුගයේ නිර්මාණය කරන්නට යෙදුන සුවිශේෂී ආරාම වර්ගයක් ලෙස පබ්බතාරාම පෙන්වාදිය හැකි ය. මේවා ඉදිකර ඇත්තේ අනුරාධපුර නගර අභ්‍යන්තරයේ නොව ඉන් පිටත වේ. පුලියන්කුලම, පාචීනතිස්ස පබ්බත විහාරය, රාමකැලේ, මැණික්දෙන, කලුදිය පොකුණ.... ආදි ස්ථානවල මෙම විහාර දැකගත හැකි ය. මෙම පර්යේෂණයේ අරමුණ වූයේ පබ්බතාරාම නිර්මාණය කිරීමේ ලක්ෂණ අධ්‍යයනය කර එම ලක්ෂණ බෞද්ධ මූලාශ්‍රය තොරතුරු සමඟ සසදා මෙම ආරාම නිර්මාණය කිරීම සඳහා පදනම් වූ කරුණු පිළිබඳ අධ්‍යයනය කිරීමයි. මේ සඳහා පර්යේෂණ ගැටලුව වූයේ පබ්බතාරාම නිර්මාණය සඳහා පදනම වූයේ බෞද්ධ ඉගැන්වීම් ද? යන්න පැහැදිළි කර ගැනීමයි. ග්‍රන්ථ සන්ධාර විශ්ලේෂණ ක්‍රමවේදය මේ සඳහා යොදා ගත් පර්යේෂණ ක්‍රමවේදය වූ අතර බෞද්ධ මූලාශ්‍රය ලෙස චුල්ලවග්ගපාලියේ අන්තර්ගත සේනාසනක්ඛන්ධකයට වැඩි අවධානය යොමුකර තිබේ. පබ්බතාරාමයන්හි සැලසුම්කරණය සෙසු ආරාමවලට වඩා හාත්පසින් වෙනස් වූවකි. සාමාන්‍ය තැනිතලා පොළොවෙහි කෘතිම වශයෙන් මාලක තනා බෞද්ධ ගොඩනැගිලිවල වැදගත්කම අනුව ඒ ඒ මාලකවල විහාරාංග ඉදිකර ඇති බව දක්නට ලැබේ. දිය අගලින් වට වීම, ප්‍රාකාරයකින් වටවී තිබීම මෙහි විශේෂ වන අතර දානශාලා, ජන්තාඝර, ධර්මශාලා, ස්තූපය, බෝධිඝරය.... ආදි බෞද්ධ ආරාමයක දැකිය හැකි විහාරාංග අන්තර්ගතව මෙම ආරාම වර්ගය නිර්මාණය කර ඇත. පබ්බතාරාමයන් හි දක්නට ලැබෙන මෙම ලක්‍ෂණ සේනාසනක්ඛන්ධකයේ ආරාම නිර්මාණය පිළිබඳ දක්වා ඇති තොරතුරු සමඟ සසදා බැලීමේ දී ගම්‍ය වන්නේ එහි අන්තර්ගත ආරාමික වාස්තු විද්‍යා ලක්ෂණ බහුල ලෙස පබ්බතාරාමයන්හි දක්නට ඇති බවයි. ලක්දිවට බුදු දහම හඳුන්වාදීමත් සමඟ මෙරට බෞද්ධ ආරාමවල ආරම්භය සිදු විය. බුද්ධ නියමයන්ට අනුකූලව ඒවා නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේලා මෙරට වැසියන්ට අනුශාසනා කළා විය හැක. දැනට ශේෂව ඇති පබ්බතාරාමයන්හි ඇති ලක්ෂණ මූලාශ්‍රය ගත තොරතුරු සමඟ සැසඳීමේ දී යම් නිගමනයකට පැමිණිය හැකි ය. එනම් බෞද්ධ ඉගැන්වීම් අනුව යමින් මෙම පබ්බතාරාම ද නිර්මාණය කර ඇති බවයි.

**ප්‍රමුඛ පද -** දිය අගල, පබ්බතාරාම, බුදු දහම, විහාර අංග, ස්තූපය, සේනාසනක්ඛන්ධකය.

# අනුරාධපුර විජයාරාමයෙහි "සභා ශාලාව" නම් ස්මාරකයෙහි නිරූපිත කැටයම් ඵලක මගින් සන්නිවේදනයවන ආගමික සංකල්ප පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**කෝස්තා එම්.සී.එස් [1], ප්‍රනාන්දු එච්.ඩී.එස් [2], වික්‍රමසිංහ ඩබ්.ඒ.එන්.ඒ [3]**

[1,2,3] ව්‍යවහාරික පුරාවිද්‍යා අධ්‍යයනාංශය, මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය, නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, ශ්‍රී ලංකාව.

sadaruwanchandu74@gmail.com

අනුරාධපුර අභයගිරි විහාර සීමාවේ සිට උතුරු දෙසට සැතපුම් එකහමාරක් පමණ දුරකින් පිහිටා ඇති විජයාරාමය අක්කර 23 ක භූමි ප්‍රමාණයකින් යුක්තය. අශෝකාරාමය, විජයාරාමය හා පෙරිමියම්කුලම් ගම්මාන වලින් වටවුණු ඓතිහාසික භූමිය ඉතා මනස්කාන්ත පරිසරයකට උරුමකම් කියයි. මෙහි ස්මාරක අංක 09 දරන "සභා ශාලාව" නම් ගොඩනැගිල්ලේ බිත්තිය ගෙබිම මට්ටමින් ඉහළට සෙ.මි 104 ක් උසට ගල් පුවරු 3 ක් යොදාගෙන නිර්මාණය කොට තිබේ. බිත්තියේ ඝණකම සෙ.මී 30 කි. ගොඩනැගිල්ලේ වේදියෙහි කැටයම් ඵලක මත ඇති මානව රූපී දිව්‍ය සහ නාග රූප මගින් සන්නිවේදනයවන ආගමික සංකල්පය පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. පර්යේෂණයේ ගැටලුව බවට පත්වූයේ මෙම කැටයම් ඵලක මගින් මහායාන, වජ්‍රයාන, තන්ත්‍රයාන ආගමික සංකල්පයක් ඉස්මතුවන්නේ ද? යන්න පිළිබඳව විමසා බැලීමයි. පර්යේෂණ ක්‍රමය යටතේ ක්ෂේත්‍ර ගවේෂණ සිදු කිරීම, ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය මගින් දත්ත රැස් කිරීම සිදු වූ අතර ක්‍රමවේදය මගින් දත්ත විශ්ලේෂණය සිදුකොට අදාළ දත්ත පාදක කරගනිමින් එම කැටයම් ඵලක මගින් නිරූපිත ආගමික සංකල්ප කවරේද යන්න තහවුරු කරගැනීම සිදුවිය. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල වශයෙන් උක්ත කැටයම් ඵලක තුල මහායානයේ ම ශාඛා දෙකක්වන වජ්‍රයාන හා තන්ත්‍රයාන ආගමික සංකල්ප ගැබ්ව ඇති බව හදුනාගත හැකිවිය. මෙම මහායානික බලපෑම පිළිබද වැදගත් සාධකයක් ලෙස ගොඩනැගිල්ලේ බිත්ති මුහුණතෙහි ඇති ශිලා පුවරුවල නිරූපිත අවලෝකිතේශ්වර බෝසතුන් හා තාරා දෙවගනගේ රූප කැටයම් දැක්විය හැකිය. එසේම මෙම කැටයම් තුලින් වජ්‍රපානී බෝසතුන් නිරූපණය වන්නේ යැයිද උපකල්පනය කල හැකිය. මන්ද විජයාරාමය වජ්‍රයානයට වැඩි නැඹුරුවක් දී කටයුතු කල නිසාත් විජයාරාමය අසල ඇති පුලියන්කුලමෙන් උක්ත කැටයම් ඵලකවල දැත් සතරක් සහිත බෝධිසත්ව කැටයමට සමානවූ ප්‍රතිමාවක් හමුවූ බව බෙල්වාර්තාවේ සදහන්වීම හේතුවෙනි. එමෙන්ම කැණීම් මගින් හමුවූ තඹ පත්තිරු මගින්ද මෙම කරුණු තවදුරටත් සනාථ වේ. මේ අනුව අනුරාධපුර විජයාරාමයෙහි "සභා ශාලාව" නම් ස්මාරකයෙහි නිරූපිත කැටයම් ඵලක කෙරෙහි මහායාන, වජ්‍රයාන, තන්ත්‍රයාන ආගමික සංකල්පයන්ගේ බලපෑමක් ඇති වූ බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පදඃ** අභයගිරිය, බෝධිසත්ව, මහායානය, වජ්‍රයානය, විජයාරාමය

# අශෝක අධිරාජ්‍යයා ධර්මප්‍රචාරය සිදුකල රාජ්‍යයන්හි ස්තූපවල ආකෘතිමය ලක්ෂණවල පවතින සමවිෂමතා පිළිබඳ අධ්‍යයනයක්

## (සාංචි ස්ථූපය, ධර්මරාජික ස්ථූපය සහ කණ්ටක ස්ථූපය ඇසුරින්)

**කෝස්තා එම්.සී.එස් [1], ප්‍රනාන්දු එච්.ඩී.එස් [2], මධුශංක ජී.ජී.ජී [3]**

[1,2,3] ව්‍යවහාරික පුරාවිද්‍යා අධ්‍යයනාංශය, මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය, නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, ශ්‍රී ලංකාව.

sadaruwanchandu74@gmail.com

තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස අශෝක අධිරාජ්‍යයා විසින් ප්‍රත්‍යන්ත ප්‍රදේශ නවයකට ධර්මප්‍රචාරය සිදුකල බවට ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය සාධක සපයයි. මේ යුගයේ ඉන්දියාවේ පැවති ස්තූප සම්ප්‍රදාය ද ප්‍රත්‍යන්ත ප්‍රදේශවලට ව්‍යාප්තවීම මේ සමගම සිදුවිය. ඒ අනුව මෙම පර්යේෂණයේ අරමුණ බවට පත්වූයේ මෙලෙස ව්‍යාප්ත වූ රටවල් නවයෙහි මුල්කාලීනව නිර්මිත ස්තූපයන්හී අකෘතිමය සමවිෂමතා  පිළිබඳ අධ්‍යයනය කිරීමයි. පර්යේෂණ ගැටලුව බවට පත්වූයේ අශෝක අධිරාජ්‍යයා  ධර්මප්‍රචාරය සිදුකල රාජ්‍යයන් නවයෙහි ස්තූප ඉදිකිරීමේදී කුමන සම්ප්‍රදායක ස්තූපවල අභාසය ලබාගත්තේද? යන්න අනාවරණය කර ගැනීමයි. පර්යේෂණ ක්‍රමය යටතේ සාහිත්‍යයික මූලාශ්‍ර, පුරාවිද්‍යාත්මක තොරතුරු හා පූර්ව පර්යේෂකයන් විසින් සිදුකර ඇති පර්යේෂණවල දත්ත මගින් තොරතුරු රැස් කිරීම සිදු වූ අතර ක්‍රමවේදය යටතේ ඉන්දියාවේ සාංචි ස්තූපයත්, පකිස්ථානයේ ධර්මරාජික ස්තූපයත් සහ ශ්‍රී ලංකාවේ මිහින්තලේ කණ්ටක ස්තූපයත් පර්යේෂණ නියැදි වශයෙන් යොදාගනිමින් ඒවාහි පවතින ප්‍රදක්ෂිණා පථ, සෝපාන පථ, දොරටු සතර, තොරණ, ගර්භය, හර්මිකාව, යෂ්ටිය සහ ඡත්‍ර යන අංගයන්ගේ පවතින සමවිෂමතා විමසා බැලීය. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල වශයෙන් ස්තූප ත්‍රිත්වයේම අඩු වැඩි වශයෙන් පවතින සමවිෂමතා හඳුනාගත හැකිවිය. සාංචියෙත් ධර්මරාජික ස්තූපයෙත් ප්‍රදක්ෂිණා පථ පවතින බව හඳුනාගත හැකිවූ අතර ප්‍රදක්ෂිණා පථ වෙත පිවිසීමට සාංචියේ සෝපාන යුගලක් හා ධර්මරාජික ස්තූපයේ තට්ටු හතරකින් යුත් සෝපානයක් පිහිටා තිබේ. නමුත් මෙවන් නිර්මාණයක් කණ්ටක චෛතිය තුළ දක්නට නොමැත. සාංචියට හා කණ්ටක ස්තූපයට ප්‍රවිෂ්ට වීමට සිව් දිශාවෙන් දොරටු සතරක් පැවතිය ද ධර්මරාජික ස්තූපයේ එක් දොරටුවක් පණක් පවතී. සාංචියේ තොරණ සතරක් හඳුනාගත හැකි වුවද ධර්මරාජික ස්තූපයේ එවැන්නක් දක්නට නොමැත. එහි සංවර්ධිත අවස්ථාවක් වශයෙන් කණ්ටක ස්තූපයේ ආයක සතර හඳුනාගත හැකිය. ස්තූප ත්‍රිත්වයේම ගර්භය අර්ධගෝලාකාර හැඩයෙන් යුක්තවන අතර හර්මිකාව, යෂ්ටිය සහ ඡත්‍ර සාංචියේත් ධර්මරාජික ස්තූපයෙත් පැවති බවට පුරාවිද්‍යාත්මක සාධක තහවුරු කරයි. සාධක නොමැතිවූවත් පූර්වකාලීන කණ්ටක ස්තූපයෙත් මෙම අංග පවතින්නට ඇතැයි උපන්‍යාසයක් ගොඩනගාගත හැකිය. අධ්‍යයනය මගින් අනාවරණය කරගත් දත්ත ඇසුරින් පැහැදිලි වනුයේ මෙම රටවල ස්තූපයේ ආකෘතිය නිර්මාණය සඳහා ඉන්දීය ස්තූප ආකෘතිය බලපා ඇතිමුත් ස්වකීය කලා සම්ප්‍රදායක් නිර්මාණය කර ගැනීමට ද උත්සුක වී ඇති බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පදඃ අශෝක, කණ්ටක, ධර්මරාජික, සාංචිය, ස්ථූපය

# වර්තමාන නාග වන්දනය පිළිබඳ කැලණි විහාරය ඇසුරින් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඩී. තිළිණි නිරංජා සඳමාලි ජයරත්න
dodammullage12@gmail.com
කොළඹ විශ්වවිද්‍යාලය

නාග වන්දනය ප්‍රාග් බෞද්ධ යුගයේ සිට ලාංකේය ජනතාව අතර ප්‍රචලිතව තිබූ ඇදහීමකි. ලාංකේය ජන සමාජය යක්ෂ. රාක්ෂ. නාග සහ දේව යන ගෝත්‍ර වලින් සමන්විතව තිබූ බවට වංශකතා සාක්ෂි දරයි. මේ අතරින් නාග වන්දනය සිදු කළ ජනතාව නාග ගෝත්‍රිකයන් වශයෙන් හඳුන්වා ඇත. නාගයා පූජණීය සත්ත්වයෙකු යැයි වර්තමානයේදි පවා ජනතාව අතර මතයක් පවති. අතීතයේ නාගයන් වන්දනා කළ නාග ගෝත්‍රිකයෝ ජලය ආශ්‍රිතව සිය ජනාවාස පිහිටුවාගෙන ඇත. ඔවුන් නාවික කටයුතු වල නිරත වූ බවත්, මැණික් කර්මාන්තයේ නිරත වූ බවටත් සධක හමු වේ. බුදුරජාණන් වහන්සේ තෙවන වර ලංකාවට වැඩම කරන්නේ චූලෝදර, මහෝදර යන නාග ගෝත්‍රික රජවරුන් අතර මැණික් පුටුවක් අරභයා හටගත් ආරවුලක් සංසිඳවීම පිණිසය. එම අවස්ථාවේදී කැලණියේ රාජ්‍ය පාලනය කළ මණිඅක්ඛිත නා රජුගේ ආරාධනය පිළිගෙන බුදුන් වහන්සේ තෙවන වර ලංකාවට වැඩම කරනු ලබන්නේ කැලණි රාජ්‍යයටය. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ වර්තමාන කැලණි පුදබිමේ සිදු විය යුත්තේ නාග වන්දනයද නැතහොත් මණිඅක්ඛිත නා රජු දේවත්වයෙන් පිදීමද යන්න විමසා බැලීමය. පර්යේෂණ ගැටළුව වන්නේ නාග වන්දනය වර්තමාන ලාංකේය ජනතාව අතර පවතීද යන්නය. මෙම පර්යේෂණය මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය පදනම් කර ගනිමින් ප්‍රාථමික, ද්විතීයික මූලාශ්‍රයයන් හා සම්මුඛ සාකච්ඡා ඇසුරින් කරනු ලබන පර්යේෂණයකි. නාගයන් වන්දනාමාන කරමින් සිටි නාග ගෝත්‍රිකයන් බුදු දහම වැළඳගැනීමත් සමග එම මිත්‍යා මත බැහැර කරමින් බෞද්ධයන් බවට පත් වූහ. ලංකාවේ රාජාවලිය දෙස අවධානය යොමු කළ විට මහානාග, ඉලනාග, සිරිනාග, බල්ලාටනාග ආදි වශයෙන් රාජ්‍ය නාමයන් කිහිපයක්ම හමු වේ. නාග ගෝත්‍රිකයන් වාසය කළ උතුරු ප්‍රදේශය අතීතයේ නාගදීපය යනුවෙන් හඳුන්වා ඇත. අතීතයේ නාග ග්‍රෝත්‍රික ජනතාවගේ නිජබිමක් වූ කැලණිය බුදුන් වහන්සේගේ පාද ස්පර්ශයෙන් පූජණීයත්වයට පත්වන්නේ මණිඅක්ඛිත නා රජු සමයේය. එහෙයින් මණිඅක්ඛිත නා රජු අතීතයේ සිට කැලණිවාසීන් විසින් දේවත්වයට නගා ඇත. වර්තමාන කැලණිය පිදබිමේ සිදුවන්නේ නාග වන්දනය ද මණිඅක්ඛිත නා රජුට පූජෝපහාර දැක්වීම, කෘතවේදීත්වය පුදකිරීම ද යන්න විමසා බැලීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය පරමාර්ථය වේ.

ප්‍රමුඛ පදඃ කැලණිය, නාග ගෝත්‍රිකයන්, නාග වන්දනය, බුදුරජාණන් වහන්සේ, මණිඅක්ඛිත නා රජු

# අරියපරියෙසන සූත්‍රයෙන් පැණෙන බුද්ධ චරිතය : විමර්ශනාත්මක අධ්‍යයනයක්

**අමිත් අසිරි පනාගොඩ**
ශාස්ත්‍රවේදී - සිව්වන වසර, බෞද්ධ අධ්‍යයන පීඨය
නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, කැලණිය.
amithpanagoda@gmail.com

බුද්ධ චරිතය ශාසනික සම්ප්‍රදායන්ගේ වෙනස්කම්, සාහිත්‍යය, කලාකෘති ආදී නොයෙක් හේතුන් නිසා විවිධත්වයකින් සමාජගත වී තිබේ. සමාජගත බුද්ධ චරිතය විවිධාකාර වුව ද බුදුරජාණන් වහන්සේ විසින් දේශිත ස්වකීය බුද්ධ චරිතය පිළිබඳ අරියපරියෙසන සූත්‍රය ඇසුරින් විමර්ශනය කළ හැක්කේ කෙසේ ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. අරමුණ වනුයේ පාලි ත්‍රිපිටකයට අයත් සූත්‍රපිටකයේ මජ්ඣිමනිකායෙහි මූලපණ්ණාසකාගත ඔපම්මවග්ගයෙහි අරියපරියෙසන හෙවත් පාසරාසි සූත්‍රය තුළින් හෙළිවන බුද්ධ චරිතයෙහි අවස්ථාවන් පිළිබඳ විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීමත් ශාස්ත්‍රීය, සාමාජීය අවධානය යොමු කිරීමත් ය. ත්‍රිපිටක, අටුවා ආදී මූලාශ්‍රය අධ්‍යයනය මෙහි පර්යේෂණ ක්‍රමවේද යයි. එහිදී සිද්ධාර්ථ බෝසතුන්ගේ කුමාර අවධිය, ප්‍රව්‍රජා අවධිය සහ බුද්ධත්වයෙන් පසු අවධිය යන අවධීන් තුනටම අදාළ තොරතුරු අනාවරණය වේ. යමෙක් ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, කෙලෙසන ධර්ම ආදියෙන් යුක්තව සිටිමින් ඊට ඇතුළත් වන දෑ ම සොයයි නම් එය අනරියපරියෙසනය ලෙස ද, යමෙක් එම ධර්මයන්ගෙන් යුක්තව සිටිය ද ආදීනව දැන ඒවායින් විමුක්ත වූ නිර්වාණය සොයයි නම් එය අරියපරියෙසනය ලෙස ද සැලකේ. සිද්ධාර්ථ කුමාරයා අනරියපරියෙසනයේ නියුතුව සිට එහි කළකිරී පැවිදිව අරියපරියෙසනයේ යෙදී බුද්ධත්වයට පත්විය. සිද්ධාර්ථ කුමාරයෝ සිය පවුලෙහි කිසිවෙකුටත් නො දන්වා මහාභිනික්මන් කළ බවක් සඳහන් නොවන අතර දෙමව්පියන්ට දන්වා මහාභිනික්මන් කළහ. දෙමව්පියන් යන්නෙන් සුද්ධෝදන රජු සහ ප්‍රජාපතී ගෝතමී දේවිය අදහස් විය. "කිං සච්ච ගවෙසී" පැවිද්ද සත්‍ය සෙවීම සඳහා ය; යන්න සමාජගත වී ඇතත් එය "කිං කුසල ගවෙසී" කුසලය කුමක් දැයි සෙවීම සඳහා යනුවෙන් නිවැරදි විය යුතුය. එසේම උන්වහන්සේගේ පැවිද්ද කෙලෙස් නැති කිරීම පිණිස, සම්බුද්ධත්වය පිණිස, නො ඉපදීම පිණිස ආදී අරමුණු සාක්ෂාත්කරණය සඳහා බව සමස්ත සූත්‍රය අධ්‍යයනයෙන් පෙනේ. බෝසතුන් ආළාරකාලාම, උද්දක රාමපුත්‍ර ඇසුරේදී ධ්‍යාන ලදහ. එහෙත් ඍධිබල උපදවාගත් බවක් නො දැක්වේ. බුද්ධත්වයට අනතුරුව දහම් දෙසීමෙහිලා මන්දෝත්සාහී වීමට ධර්මයෙහි ගැඹුරු බව, අතක්කාවචර බව, දේශනා කළද නො වැටහේ නම් හුදෙක් වෙහෙසක් පමණක් බව ආදී කරුණු බලපෑහ. සහම්පතී බ්‍රහ්මයා ප්‍රථම ධර්ම දේශනයට ආරාධනා කළහ. පස්වග මහණුන් පිළිබඳ දැක්වීමේ දී "මහණුන්" යනුවෙන් භාවිතා කර තිබීම සුවිශේෂී ය. බුද්ධ චරිතය විවිධාකාරයෙන් සමාජගතව පැවතියද බුද්ධ දේශිත ස්වකීය චරිතය විටෙක සමාජගත අදහසට තරමක් විතැන්ව සහ තවත් විටෙක ඉඳුරාම වෙනස්ව දේශිත බව අරියපරියෙසන සූත්‍රය විමර්ශනයේදී පැහැදිලි වේ.

ප්‍රමුඛ පද : අරියපරියෙසනය, බුද්ධ චරිතය, මහාභිනික්මන, පස්වග මහණුන්

# ටිබෙට් ආකාශ භූමදානය හෙවත් කුරුලු දානය කෙරෙහි බුදුදහමේ බලපෑම පිළිබඳ විමර්ෂණාත්මක අධ්‍යයනයක්.

ඊරියගොල්ලේ ඥාණරතන හිමි, seneldinuka08@gmail.com 0787332656
අමුගොඩ ධම්මජීව හිමි, dhammajeewa1@gmail.com 0775729244
ඩබ්. ඩී. හරිත සත්සර, thathsaraharitha@gamil.com 0775891229
බෞද්ධ අධ්‍යයන පීඨය
නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය - කැලණිය

එහෙත් ලංකාව, බුරුමය ආදී ථෙරවාදී බෞද්ධ රටවලත් චීනය, කොරියාව, ටිබෙටය ආදී මහායාන බෞද්ධ රටවල මෙන්ම මිනිසාගේ උපතේ සිට මරණය දක්වා සියලු වැදගත් සංසිද්ධීන්හි බුදුදහමේ අභාෂය දැකිය හැකිය. බෞද්ධයකු මියගිය විට මෘත දේහය සම්බන්ධයෙන් පිළිපදින චාරිත්‍ර කිහිපයක් බෞද්ධ රටවල දැකිය හැකිය. ආදාහනය කිරීම, භූමදානය කිරීම, සතුන්ට ආහාර පිණිස මළ සොහොනකට ගෙන ගොස් දැමීම, ගඟ දියේ පා කිරීම ආදිය ඉන් කිහිපයකි. ටිබෙට් රාජ්‍යයෙහි මෙම අවමංගල්‍ය චාරිත්‍ර අතරට සුවිශේෂ චාරිත්‍රයක් ඇතුළත් වේ. එනම් මෘත ශරීරය කොටස් වලට කපා ගිජුලිහිණියන්ට ආහාර පිණිස දැමීමය. ආකාශ භූමදානය, ආකාශ දානය නැතහොත් කුරුලු දානය යනුවෙන් හඳුන්වන්නේ උක්ත චාරිත්‍රයයි. මෙම පර්යේෂණයේ අභිප්‍රේතාර්ථය ආකාශ දානය කෙරෙහි බුදුදහමේ බලපෑම පිළිබඳ අධ්‍යයනය කිරීමයි. ටිබෙටය යනු අතීතයේ පටන් මළවුන් කෙරෙහි බැඳී පවත්නා විශ්වාසයන්ගෙන් ගහණ ජනතාවක් සහිත දේශයකි. අධික ශීත දේශගුණය හේතුවෙන් මෘත ශරීර පොළොවට පස් නොවීම ද පාෂාණමය කඳුකර භූමියක් බැවින් මිණී වලවල් කැපීම අපහසු හෙයින් ද ආදාහනය කිරීම සඳහා අවශ්‍ය දැව දුලභ නිසා ද මෙවැනි චාරිත්‍රයක් ටිබෙට් ජනතාව අතර ප්‍රචලිත වී ඇත. ටිබෙට් ජාතිකයකු මියගිය විට එම දේහය දවස් තුන හතරක් සුදු රෙද්දකින් ඔතා හිස ආවරණය නොකොට නිදහස්ව තබන්නේ විඥානයට පහසුවෙන් දේහයෙන් ඉවත් යාමට ඉඩ තබමිනි. මෘත දේහයෙන් ඉවත්ව යන විඥානය දින 49 ක කාලයක් අන්තරාභව තත්ත්වයේ පසු වේ. අනතුරුව විඥානයෙන් තොර වූ මෘත ශරීරය ලාමාවරයෙකුගේ ආශිර්වාදයෙන් යුතුව ජලයෙන් පවිත්‍ර කර අවමංගල්‍ය කටයුතු කරන ස්ථානය කරා ගෙනයයි. බොහෝ විට මෙම ස්ථානය බෞද්ධාරාමයක් ආශ්‍රිතව පිහිටුවා ඇත. අනතුරුව දේහය කුඩා කොටස් වලට කපා ගිජුලිහිණියන්ගේ ආහාරය පිණිස දමයි. ඇටකටුද සිහින්ව කුඩුකර බාර්ලි පිටි හා මිශ්‍ර කර කුරුල්ලන්ට දමන්නේ මෘත ශරීරයේ කිසිවක් ඉතිරි නොවන පරිදිය. විඥානය පහව ගිය ශරීරය දිරාගිය දරකඩක් මෙන් යැයි භාග්‍යවතුන් වහන්සේ දේශනා කර ඇත. ටිබෙට් ජාතිකයන් විඥානය පහව ගිය ශරීරය දානයක් බවට පත් කරගෙන ඇත්තේ බෞද්ධ ඉගැන්වීම් මත පදනම්වය.

ප්‍රමුඛපද :- ආකාශ දානය, ටිබෙටය, බුදදහම, මෘත ශරීරය, සංස්කෘතිය

# The Theravada Buddhist Perspective of Abortion with Reference to the Pāli Canon.

**Ven. Kalalgoda Sudarshika**
Sri Lanka International Buddhist Academy (SIBA)
Pallekele
dilmihansani2000@gmail.com

Buddhism, one of the major religions globally, is an empiricist and ant metaphysical religion that teaches timeless teachings. Its unique teachings, which are timeless and applicable to the 21st century, align with modern science's fundamental notions of independence. Abortion, a controversial human task, is currently being discussed as a proposal to control the world's population growth rate. Buddhist views on abortion have been discussed by scholars, but there has not been a generally accepted norm. Abortion in Buddhism does not mean the loss of a child spontaneously or due to some reason, but intentional or scientific abortions. In ancient India, abortion was regarded as an immoral and despicable thing before the birth of Lord Buddha. Buddhist teachings emphasize suicide as a bad karma and destroying a human life as a serious evil. According to the pārājikā precept, committing a human murder is a great wrong and leads to complete loss of monkhood. The Buddha's time allowed the age of a novice to be determined by taking the gestational age, confirming that the conceived human organism has full human rights. An ordained monk should not knowingly destroy the life of a living being, even an ant. Then according to Buddhism, abortion is a murder or if someone knowingly aborts a human body by their subordinates, will they be followers of Buddha? To achieve these objectives, qualitative research method limited to a textual study has been adopted focusing the Suttantapiṭaka as the primary source concerning secondary sources as well.

*Key words: Buddhism, Abortion, pārājikā, Suttantapiṭaka, human rights*

# A Comparative Study on the Marital Satisfaction and Happiness in Buddhist and Western Contexts.

**Ven. Kalalgoda Sudarshika**
Sri Lanka International Buddhist Academy (SIBA)
Pallekele
dilmihansani2000@gmail.com

If a successful marriage is a strong door, the doorknob and key in the family are the husband and wife. There were various norms and customs regarding marriage since ancient time in India during the time of the Buddha. Their main goals of marriage are to have a son for religious activities, to develop one's generation and to seek reciprocity. In Buddhist perspective, importance of soft skills is highlighted along with mutual responsibilities through the teachings included in the *Suttantapiṭaka.* Hence research problem is designed as; what is the Buddhist perspective towards Happy Marriage comparatively with Western perspective? The significance of this research indicates its contribution to minimize the ongoing catastrophes in domestic sphere with the guidance of Buddhist teachings and it supports the objectives of this research to identify main causes of unsuccessful marriages and also to highlight the path of ceasing them. To achieve these objectives, qualitative research method limited to a textual study has been adopted focusing the *Suttantapiṭaka* as the primary source concerning secondary sources as well. Many lovely memories of the inseparable broken tie of family after marriage, the stillness of love, are discussed in the book "I am Troy Davis" by Troy Anthony Davis. Importantly, Universal Declaration of Human Rights (UDHR) is a major milestone in the history of human rights concerning social validity for marriage along with many other rights help to avoid intimate partner violence. Finally, this comparative analysis resulted that Buddhist teachings does not highlight the rights but pay attention to the causes of problems in the marriage while simultaneously proposing pragmatic ethical code to cease those causes fulfilling responsibilities of each individual.

**Keywords:** *Buddhism, Suttantapiṭaka, Soft Skills, Marriage, UDHR*